සම්ප්‍රදායික කර්මාන්ත රැසක් ස්ථාපනය වී පැවති මහනුවර ප්‍රදේශය තුළ, 19 වන සියවස වන විට බ්‍රිතාන්‍යයන් විසින් මුල්වරට මෙම ප්‍රදේශවල කෝපි වගා කිරීම ආරම්භ කළහ. ක්‍රි.ව. 1822 වර්ෂය වන විට ප්‍රථම වරට ජොර්ජ් බර්ඩ් නැමැත්තා විසින් ගම්පොළ සිංහපිටිය ප්‍රදේශයේ කෝපි වත්තක් ආරම්භ කරන ලදී. ක්‍රි.ව 1804 වර්ෂයේදී ෆෙඩ්රික් නොර්ත් ආණ්ඩුකාරවරයාගේ පාලන සමය තුළ මෙරට මුල්වරට කෝපි කෙටීමේ මෝලක් ආරම්භ කරන ලදී. ක්‍රි.ව. 1824 වර්ෂයේදී එඩ්වඩ් බාන්ස් විසින් පේරාදෙණියට නුදුරු ගන්නෝරුව ප්‍රදේශයේ පෞද්ගලික කෝපි වත්තක් ආරම්භ කරන ලද අතර බ්‍රිතාන්‍යය වැවිලිකරුවන් අනුගමනය කරමින් රජයේ නිලධාරිහු ද කෝපි වැවීම ආරම්භ කරන ලදී. කෝපි වගා කිරීම සඳහා බ්‍රිතාන්‍යය රජය විසින් අනුග්‍රහය ලබාදුන් අතරම කෝපි සඳහා අය කළ තීරු බද්ද ඉවත් කරන ලදී (ජයවර්ධන 2014: 37).

ක්‍රි.ව 1830 පමණ වන විට මහනුවර දුම්බර මිටියාවතේ ද, ගම්පොළ, පේරාදෙණිය අවට ප්‍රදේශවල ද කෝපි වතු ව්‍යාප්ත වෙමින් පැවතිණ. ක්‍රි.ව. 1837 වර්ෂයෙන් පසු කෝපි වගාව ඉතා සාර්ථක වූ අතර බ්‍රිතාන්‍යය ආණ්ඩුවේ නිලධාරීන් මෙන්ම විදේශිකයන් ද කෝපි වගා කටයුතු සිදුකිරීමත් සමඟ ක්‍රි.ව 1840 පමණ වන විට මහනුවර අවට ප්‍රදේශ බොහෝමයක කෝපි වතු ව්‍යාප්ත විය. ක්‍රි.ව. 1840 -1850 අතර කාලපරිච්ඡේදය තුළ දුම්බර මිටියාවතේ වත්තේගම ප්‍රදේශයට කෝපි වගා කිරීම සඳහා බ්‍රිතාන්‍යයන් පැමිණ ඇත. ඇල්කඩුව, පන්විල, කබරගල, බඹරැල්ල හා තෙල්දෙණිය ප්‍රදේශයේ රංගල කෝපි වතු ආරම්භ කිරීම ඔවුන් අතින් සිදුවිය. ක්‍රි.ව 1840 වන විට වත්තේගම හුන්නස්ගිරි කන්ද ආශ්‍රිත ප්‍රදේශවල සරුසාර කැළෑ එළිකරමින් කෝපි වගාවන් ආරම්භ කළ බව සඳහන් වේ (ජයවර්ධන 2014: 37). වත්තේගම ප්‍රදේශයේ බ්‍රිතාන්‍යයන් විසින් ආරම්භ කළ වතු අතර නවයාලතැන්න මාර්ටින් වත්ත, පොල්ගොල්ල ඇත්ගාල ප්‍රදේශයේ පිහිටි රදර්ලන්ඩ් බංගලාව පිහිටි වත්ත, මීගම්මන දුම්කොළ වත්ත, සී.ඒ. ප්‍රෙන් හා වයිට් ආරම්භ කළ වල් අරඹවත්ත, උඩුගොඩ ගුනැම්බල් වතුයාය, උඩුගොඩ සෙන්මේරි වතුයාය, රාජ්ස ඇල්ල ආසන්නයේ නයිස්ඩේල් වතුයාය, උඩුගොඩ ග්ලාස් ටවුන් වතුයාය, වත්තේගම වයිට්වෙලෝ වතුයාය, වත්තේගම ප්‍රැන්ක්ලන්ඩ් වතුයාය හා සිම්සන් කැලේ වතුයාය දැක්විය හැකිය. කෝපි කර්මාන්තශාලාවන්ට ජලය අවශ්‍ය වන බැවින් නිම්න ආශ්‍රිතව එම කර්මාන්තශාල ඉදිකර තිබිණි.

නවයාලතැන්න මාර්ටින් වතුයායේ දෙවන එළිසෙබෙත් රැජිනගේ ඥාතිවරයෙකු වූ මවුන්ටන් බැටන් ස්වාමිවරයා විවේක සුවයෙන් ගත කළ බංගලාවක් එහි වන අතර ජලය රත් කළ පැරණි පෝරණුවක් හා ගලින් බැඳි ජල ටැංකි දෙකක් වේ. මීගම්මන වතුයාය මුල්වරට දුම්කොළ වගා කිරීම සඳහා යොදාගත් අතර පසුකාලීනව කෝපි හා තේ වගා කිරීම සිදුකළහ. එම වතුයාය සඳහා ජල ලබාගෙන ඇත්තේ තෙප්පුකුලම වැව මඟිනි (ජයවර්ධන 2014: 37). මෙම වතු බංගලාව ආශ්‍රිතව අශ්වයින් බැඳීම සඳහා ස්තාලයක් වූ බව සඳහන් වේ. ක්‍රි.ව 1901 වර්ෂයේදී චාල්ස් ගිබන්, ජෝසප් හොලවේ හා මේජර් ගැරට් විසින් වත්තේගම වතු සංගමයක් ආරම්භ කළ අතර නයිස්ඩේල් නමින් වතු වීදියක් මෙම ප්‍රදේශය තුළ බ්‍රිතාන්‍යයන් විසින් ඉදිකරන ලදී. ක්‍රි.ව 1858 වර්ෂය වන විට හැමිලියා වෙස්ට්‍රාටික්ස් නැමති කෝපි කොළ කොඩවීයාමේ රෝගයක් වැළඳීම හේතුවෙන් කෝපි වගාව පරිහානියට පත් වී මෙම ප්‍රදේශ තුළ තේ වගාව ආරම්භ කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව 1865 වර්ෂයේදී මහනුවර, දෙල්තොට ලූල්කඳුර ප්‍රදේශයේ ජේම්ස් ටේලර් විසින් ප්‍රථම වරට තේ වත්තක් ආරම්භ කර තේ නිෂ්පාදනය කිරීම සඳහා ඔහුගේ නිවාසය යොදාගන්නා ලදී. වර්තමානය වන විට ඔහුගේ නිවාසයේ පැවති විම්නිය පමණක් දක්නට ඇත. ක්‍රි.ව 1923 වර්ෂයේදී ලූල්කඳුර


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

වතුයාය මුල්කරගනිමින් තේ කර්මාන්තශාලාවක් ඉදිවූ අතර එය මුහුදු මට්ටමේ සිට අඩි 3600ක පමණ උසකින් පිහිටි කර්මාන්තශාලාවකි (ඡායාරූපය අංක 02). මහල් තුනකින් යුත් මෙම තේ කර්මාන්තශාලාව ලෝහ තහඩු, දැව හා කළුගල් බිත්තිවලින් බැඳ ඇත. ක්‍රි.ව. 1903දී ඉදිකරන ලද පිළිමතලාව ගිරාගම තේ කර්මාන්තශාලාව, ක්‍රි.ව 1925 වර්ෂයේදී ඉදිකරන ලද හන්තාන තේ කර්මාන්තශාලාව, ක්‍රි.ව 1925 වර්ෂයේ ඉදිකරන ලද අංකුඹුර මීසන් තේ කර්මාන්තශාලාව හා ක්‍රි.ව 1946දී කරවන ලද පිළිමතලාව ඇඹිල්මීගම කර්මාන්තශාලාව මහනුවර ප්‍රදේශයේ පවතින පැරණි තේ කර්මාන්තශාලා වේ. මෙම තේ කර්මාන්තශාලාවල නිෂ්පාදන කටයුතු සිදුකිරීම සඳහා යන්ත්‍රසූත්‍ර රාශියක් භාවිතා කරනු ලබයි.

ඒ අතර එලිවේටර්, දළු ප්‍රවාහනය කරන යන්ත්‍ර, දළු මැලවීමේ බක්කි, දළු කැපුම් යන්ත්‍ර, කෝතෝ ඩොක්ස් ඇඹරුම් යන්ත්‍ර, ද්විත්ව ක්‍රියාකාරී රොටර් වේන් ඇඹරුම් යන්ත්‍ර, කුඩු හැලීමේ යන්ත්‍ර, උෂ්ණත්ව පාලන වියලුම් යන්ත්‍ර, බලශක්ති උත්පාදන යන්ත්‍ර, තේ පෙට්ටි අසුරන යන්ත්‍ර හා බර කිරීමේ උපකරණ දැකිය හැකිය. එම යන්ත්‍ර Gilbert Gilkes & Gordon Ltd, Colombo Commercial Company (CCC), Ruston & Hornsby, Herbert Morris Limited, Marshall Sons & Co Ltd, Walker Sons & Co Ltd, Davidson & Plait Co Ltd,



ඡායාරූපය අංක 01 - ජේම්ස් ටේලර්ගේ නිවාසයේ පැවති චිමිනිය

F.H Bentall & Sons Ltd, Vandome Titford Co Ltd, Avery, S & Co Engineers, හේලිස් සමාගම, බ්‍රවුන්ස් සමාගම, වෝකර්ස් සමාගම හා පී.පී. පියදාස ජිනසේන නම් සමාගම්වල නිෂ්පාදන බව පෙන්වාදිය හැකිය.



ඡායාරූපය අංක 02 - ලූල්කඳුර තේ කර්මාන්තශාලාව

මීට අමතරව තේ කර්මාන්තශාලාවල පැරණි ඔරලෝසු, පැරණි දුරකථන, තේ බොයිලේරු, ජල පෙරණ, මුදල් සේප්පු හා පැරණි දැවමය පුටු දක්නට ලැබේ. තවද 1919.12.07 වන දින තේ වතු සඳහා ජලය ලබාගත් කළුගලින් කරන ලද පැරණි ළිඳක් යටිනුවර මාදිලිගම තේ කර්මාන්තශාලාවක් ආශ්‍රිතව දක්නට ලැබේ.

වතු අධිකාරිවරුන්ගේ වාසය සඳහා උඳුන් සහිත කළුගලින් ඉදිකරන ලද බංගලා කිහිපයක් බැද්දේගම, ඉගුරුගොල්ල, ශ්‍රියාගම වතු ආශ්‍රිතව දක්නට ලැබෙන අතර වතු කම්කරුවන් සඳහා තනි පේළි නිවාස, ද්විත්ව පේළි හා එකිනෙක පිටුපසින් පිහිටි නිවාස ලෙස වන අතර ඒවා ගල්, මැටි, දැව හා තහඩු යොදාගෙන නිමකරවා ඇත. මුළුතැන්ගෙය නිවසට ඉදිරිපසින් ඉදිකළ අතර නිවස ඉදිරියේ වූ පිල ගල් තාර ගැලුම් 02, කීල රාත්තල් 1 1/2ක්, ගල් දුම්මල රාත්තල් 1/2ක්, පිරිසිදු වැලි බුසල් 02ක් යොදාගෙන නිර්මාණය කරන ලදී (සිල්වා 2005: 200). මීට අමතරව වතු ආශ්‍රිතව වතු රෝහල් හා ඩිස්පෙන්සරි ඉදිකරන ලද අතර මොවුන්ගේ ආගමික කටයුතු සඳහා කෝවිල් හා ඇන්ග්ලිකන් දේවස්ථාන නිර්මාණය කරන ලදී.

## 02. ප්‍රවාහනය

### 2.1 මහාමාර්ග

කඳුකර සහිත ප්‍රදේශවල අභ්‍යන්තරයේ පැවති වනාන්තර එළිපෙහෙළි කරමින් යටත් විජිත පාලන සමය තුළ මහාමාර්ග ඉදිවිය. මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ මහාමාර්ග ඉදිකිරීම සඳහා මූලික වූයේ වැවිලි කර්මාන්තයයි. ක්‍රි.ව 1820 වර්ෂයේදී එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයාගේ පාලන සමය තුළ කොළඹ - මහනුවර දක්වා සැතපුම් 72කින් යුත් මහාමාර්ගයක් ඉදිවුණු අතර මෙම මාර්ගය හා සම්බන්ධ වෙමින් සෙසු මාර්ග මහනුවර ප්‍රදේශය තුළ ජාල ගතවිය. විල්මට් හොර්ටන්, ආණ්ඩුකාර ධුරයට පත්ව මහනුවර ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් මහාමාර්ග කිහිපයක් ඉදිකරන ලදී. එනම්,

01. මහනුවර - දඹුල්ල - අනුරාධපුරය හරහා පේදුරුතුඩුව තෙක් වූ මාර්ගය
02. මහනුවර - මහඔය - බෙලිහුල් ඔය - කුරුඳුඔය හරහා බදුල්ල තෙක් වූ මාර්ගය (මුණසිංහ 2000:140)

කෝපි වගාවත් සමඟ ක්‍රි.ව 1832 පමණ වන විට මහනුවර ආශ්‍රිත තුම්පනේ, හාරිස්පත්තුව හා දුම්බර ආදී ප්‍රදේශවල මහාමාර්ග පද්ධතිය ව්‍යාප්ත වන්නට විය. කෝපි වගාව කළ ප්‍රදේශවල පැවති යටිතල පහසුකම් අවම වූ හෙයින් අස්වැන්න හා කෝපි වගාවට අවශ්‍ය පොහොර වැනි දෑ ප්‍රවාහනය කිරීමේදී වගාකරුවන් මහත් දුෂ්කරතාවලට පත්විය. මේ හේතුවෙන් කෝපි වගාකරුවන්ගේ බලවත් ඉල්ලීම පරිදි කෝපි වගාවන් ආශ්‍රිතව මාර්ග පද්ධතියක් ඉදිකිරීමට එවකට බ්‍රිතාන්‍ය ආණ්ඩුව පියවර ගනු ලැබිණ. එහි ප්‍රතිඵලයක් ලෙස කරත්ත මාර්ග ලෙස පැවති මාර්ග තාර දමා සකස් කරන ලදී.

01. මහනුවර - නුවරඑළිය හරහා බදුල්ල තෙක් වූ මාර්ගය
02. මහනුවර - හඟුරන්කෙත මාර්ගය
03. මහනුවර - හාරගම - මඩොල්සිම හරහා බදුල්ල තෙක් මාර්ගය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

04. මහනුවර - කබරගල මාර්ගය

05. මහනුවර - ගිනිගත්හේන මාර්ගය ඒ අතර වැදගත් වේ. (මුණසිංහ 2000:141)

ක්‍රි.ව 1861 වර්ෂයේ කඩුගන්නාව - ගම්පොළ දක්වාත්, ක්‍රි.ව 1868 දී කටුගස්තොට සිට කුරුණෑගල දක්වාත්, ක්‍රි.ව 1871 වර්ෂයේ පේරාදෙණිය - ගලහ - දෙල්තොට දක්වාත්, 1871 - 1902 දක්වා කාලපරිච්ඡේදය තුළ කබරගල, පන්විල, බඹරැල්ල හා මඩුල්කැලේ ආදී ප්‍රදේශවල මාර්ග පද්ධතියක් බිහිවිය. ක්‍රි.ව 1932 වර්ෂයේදී තලාතුඔය සිට හඟුරන්කෙත දක්වා වූ කරත්ත මාර්ගය වැඩිදියුණු කර සැතපුම් 08කින් පමණ දිගු මාර්ගයක් ඉදිකරන ලදී. මුල්වරට කොළඹ - මහනුවර මාර්ගය බොරළු දමා සකස් කළ ද ක්‍රි.ව 1841 වන විට කළුගල් අතුරා ඉදිකිරීමත් සමග මහනුවර සිට කොළඹ යාමට කරත්තවලට පහසු වූ බව සඳහන් වේ. ටෙල්ෆඩ් ක්‍රමය යටතේ ඉදිවුණු මාර්ග කරත්ත ගමන් කිරීමත් සමඟ නිතර ප්‍රතිසංස්කරණය කිරීමට වූ බව සඳහන් වේ (මුණසිංහ 2000:150). ඉන් පසුව කොළඹ - මහනුවර මහාමාර්ගයේ පවතින පේරාදෙණිය පාලමේ ඉදිකිරීම් කටයුතු වලදී මැකඩම් ක්‍රමය යටතේ කළුගල් දමා ගල් රෝල් වලින් සමතලා කළ බව සඳහන් වේ. 20 වන සියවස වන විට මෙරට මෝටර් රථ ධාවනය වීමත් සමඟ බ්‍රිතාන්‍යයන් විසින් මාර්ගවලට තාර යෙදූ බව කියවේ (මුණසිංහ 2000:150).

මෙම ප්‍රදේශවල මහාමාර්ග ඉදිවීමත් සමග කළුගලින් නිමකරන ලද සැතපුම් කණු හා වාත්තු යකඩින් කරන ලද පැරණි මාර්ග සංඥා රැසක් ඉදිවිණි. කොළඹ - මහනුවර, කඩුගන්නාව - අලගල්ල මාර්ගය, ඊරියගම - අලදෙණිය මාර්ගය, පේරාදෙණිය - දෙල්තොට මාර්ගය ඇතුළු මාර්ග කිහිපයක තැනින් තැන පැරණි මාර්ග සංඥා අදටත් ශේෂ වී ඇත. කොළඹ - මහනුවර මහාමාර්ගයේ අවසාන සැතපුම් කණුව වන 72 වන කණුව දළදා මාලිගය අසල වැව රවුමේ දැකගත හැකිවන අතර එහි මුහුදු මට්ටම් උස, වැව රවුම වටා ඇති දුර ප්‍රමාණය ද සටහන්ව තිබේ. Made at the Govt. Factory Colombo by Order EE Matale ලෙස විද්‍යානයන් සිදුකරන ලද බව සඳහන් වාත්තු යකඩින් කළ මාර්ග සංඥා කිහිපයක් මහනුවර කටුකැලේ, පිළිමතලාව, පලීපාන හා හතරලියද්ද ප්‍රදේශවල ශේෂ වී ඇත. මහනුවර ප්‍රදේශය තුළ මහාමාර්ග ඉදිකිරීමේදී බිම්ගෙවල් කිහිපයක් සකස් කරන ලද අතර උසින් මීටර් 4.5ක්, දිගින් මීටර් 9ක්, පළලින් මීටර් 5ක් වන කඩුගන්නාව බිම්ගෙය හා අඩි 537කින් යුත් පැරණි මහනුවර - කුරුණෑගල මාර්ගය වැටී පැවති මාර්ගයේ අනිවත්ත බිම්ගෙය ඒ අතර වැදගත් වේ. ක්‍රි.ව 1911 වර්ෂයේදී ජේ. ආර්. මංචනායක නම් තැනැත්තකු විසින් තෙල්දෙණිය හා රංගල මාර්ගයේ හමුවන උඩිස්පත්තුව නගරයේ, එංගලන්තයේ පස්වන ජෝර්ජ් රජුගේ රාජාභිශේකය සිහිවීම පිණිස මාර්ගය ඉදිකරන සමයේ පිහිටවූ සිහිවටනයක් පවතී. මෙම ශිලා පුවරුව උසින් මීටර් 1.08ක් ද, පළලින් සෙ.මී. 93ක් ද වේ. කොළඹ - මහනුවර මහාමාර්ගය ඉදිකිරීම සඳහා සහය ලබාදුන් කැප්ටන් ඩෝසන් රෝගයක් වැළඳී මියගිය බැවින් ඔහු සිහිවීම පිණිස මාර්ගය ආසන්නයේ ක්‍රි.ව 1832 වර්ෂයේ අඩි 125ක් උසින් යුක්ත වන ඩෝසන් කුලුන ඉදිකරන ලදී (Administrative report 1913).

මහාමාර්ග ඉදිකිරීම් සඳහා යොදාගත් යන්ත්‍රසූත්‍ර රැසක් පිළිමතලාව මහාමාර්ග කෞතුකාගාරය තුළ වන අතර අලි ඇතුන් හා ගවයන් විසින් අදිනු ලැබූ ගල් රෝල C.A. Hutson & Co Ltd යන සමාගම විසින් නිෂ්පාදනය කර ඇත. වාෂ්ප බලයෙන් ක්‍රියාකරන Aveling & Porter, Aveling and Barford හා Marshall and Sons යන සමාගම් වලින් නිෂ්පාදිත ගල් රෝල් කිහිපයක්, Allen & Sons හා Barford & Perkings යන සමාගම් වලින් නිෂ්පාදිත පොළොව කැඩීමේ යන්ත්‍ර මෙන්ම පොළොව සිරීමේ යන්ත්‍ර දක්නට ලැබේ (ජයසිංහ 2022: 84).

ක්‍රිව. 1826 වර්ෂය තුළ කොළඹ - මහනුවර මහාමාර්ගයේ නානුඔය හරහා ඉදිකරන ලද ආරුක්කු තුනකින් යුත් උළුවම් පාලම කැප්ටන් ඒ බ්‍රවුන් විසින් කරවන ලද බව සඳහන් වේ (Bingham 1921: 192). ලක්දිව පාලම් ඉතිහාසයේ උත්කෘෂ්ට නිර්මාණයක් වන පේරාදෙණිය බුරුත ලී පාලම ක්‍රි.ව 1833 වර්ෂයේ ඉදිකරනු ලැබිණ. තනි ආරුක්කුවක් සහිත මෙම පාලම ඉදිකිරීම සඳහා භාරදෙනු ලැබූයේ ලුතිනන් ජනරාල් ෆ්‍රෙෂර්ටය (Bingham 1921: 194). මෙම පාලමේ දැව කොටස කොළඹ ක්වාටර් මාස්ටර් ජනරාල් කාර්යාලයේදී නිර්මාණය කර අතර පේරාදෙණියට ප්‍රවාහනය කර සවිකර තිබේ. කොළඹ - මහනුවර මාර්ගයට පරිබාහිරව ක්‍රි.ව 1847 වර්ෂයේ මහනුවර - හාරගම මාර්ගයේ ඩියුරන් කර්ෂෝ විසින් ගඩොල් වලින් නිම කළ ආරුක්කු දෙකකින් යුත් ගඩොල් පාලමක් ඉදිකරන ලදී (Bingham 1913: 203). ක්‍රි.ව 1848 වර්ෂයේ මහනුවර - මාතලේ දක්වා වූ මාර්ගයේ පල්ලේ මහයියාව ප්‍රදේශයේ ඇල මාර්ගයක් හරහා ගඩොලින් බෝක්කුවක් ඉදිකරන ලදී. ක්‍රි.ව. 1859 වර්ෂයේදී මාතලේ, පන්විල, කබරගල, රංගල, නකල්ස් හා කුරුණෑගල යන ප්‍රදේශ මහනුවර නගරය හා සම්බන්ධ කරමින් මහවැලි ගංගාව හරහා කටුගස්තොටදී පාලමක් ඉදිකරන ලදී (Balasingham 1968: 38). කටුගස්තොට පාලම ජේ. ඒ කැලේ විසින් ඉදිකරන ලද අතර ලිපිකරු ලෙස ඩබ්ලිව්. ලැපන් කටයුතු කර ඇත. මෙම පාලම අඩි 140ක් බැගින් යුත් වූ කොටස් තුනක් වන අතර පාලමේ මුළු දිග අඩි 420කි (Silva 1985: 222). හෝව් කාප්ප ක්‍රමයට නිම කළ මෙම පාලම ඉදිරිමේ අධීක්ෂණ කටයුතු ඊ.සී. ඩේවිස් විසින් සිදුකරන ලද අතර රජයේ කර්මාන්තශාලාව මගින් ඉදිකිරීම් කරන ලදී (Bingham 1921 :78). කටුගස්තොට පාලම 1939 වර්ෂයේදී වර්තමානයේ දක්නට ලැබෙන පරිදි නැවත ඉදිකරන ලදී.

ක්‍රි.ව 1858 - 1860 කාලපරිච්ඡේදය තුළ කටුගස්තොට පිඟා ඔය හරහා අඩි 120කින් යුත් පාලමක් ඉදිකළ අතර එය ජේ. රොබට්සන් විසින් ඉදිකරන ලදී. ඩබ්ලිව්. වේලුපිල්ලේ විසින් ක්‍රි.ව 1860 වර්ෂය තුළ නවයාලතැන්න පුස් ඇලි ඔය හරහා අඩි 50කින් යුක්ත වන පාලමක් නිර්මාණය කළහ. තවද ජේ. ඒ. කැලේ විසින් බඹරැල්ල මාර්ගයේ අඩි 40කින් යුත් හුළු ගඟ හරහා ද, අඩි 50ක් පමණ වූ ලෙනගල ඔය හරහා හා අඩි 80ක් පමණ දිගින් යුත් දළුක් ඔය හරහා පාලම් තුනක් ඉදිකරන ලදී. තවද ජේ.ඒ කැලේ විසින් ක්‍රි.ව 1859 - 1860 අතර කාලය තුළ අඩි 80කින් යුත් පාලමක් තනන ලදී (Bingham 1921 :78). ක්‍රි.ව 1859 වර්ෂයේදී කොත්මලේ හා දිඹුල යන ප්‍රදේශ සම්බන්ධ කිරීම සඳහා මහවැලි ගඟ හරහා ගම්පොළ


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

පාලම කැප්ටන් ග්‍රැහැම් විසින් ඉදිකරන ලදී (Bingham 1921 :203).

ක්‍රි.ව 1876 වර්ෂයේදී කොස්පොතු ඔය හරහා උදලාගමදී පාලමක් ඉදිකරන ලදී. ක්‍රි.ව 1900දී හැදෙණිය හා අලදෙණිය ප්‍රදේශයේ කුරුණෑගල මාර්ගයේ තනි ආරුක්කුවකින් යුත් ගඩොලින් සකස් කරන ලද බෝක්කුවකි. ක්‍රි.ව 1904 වර්ෂයේ ඉදිකරන්නට ඇතැයි සැලකෙන උඩුකුරු දුණුදිය පාලමක් පැරණි පිළිමතලාව - පොත්තපිටිය මාර්ගයෙහි අලකොලංග ඔය හරහා ඉදිකර ඇත (Kodithuwakku 1997: 34). මෙම පාලම සඳහා විශාල ප්‍රමාණයේ යකඩ බාල්ක යොදාගෙන ඇති අතර පාලම දිගින් මීටර් 44.65ක් වේ. ක්‍රි.ව. 1904 වර්ෂයේදී උලපනේ හා කොත්මලේ ප්‍රදේශ යාකරමින් ඊ.සී. ඩේවිස් විසින් යටිකුරු දුණුදිය පාලමක් ඉදිකරන ලදී. එය මීටර් 58.90ක දිගින් යුක්ත වේ. ක්‍රි.ව 1929 වර්ෂයේදී රඹුක්කන ඔය හරහා බ්‍රිතාන්‍යයන් විසින් හතරලියද්ද ප්‍රදේශයේදී තනි ස්පෑන් එකකින් යුත් දිගින් මීටර් 19.9ක් පමණ වන පාලමක් ඉදිකරන ලදී. එය N Truss වර්ගයේ කාප්පවලින් යුත් යකඩ බීම් සවිකරන ලද පාලමකි. මෙම පාලමෙහි ගලින් නිම කළ බැම්ම මත එලක කිහිපයක් වේ. පේරාදෙණිය - ගම්පොළ දක්වා වැටී ඇති මාර්ගයේ අඟුණාවල ප්‍රදේශයේදී ක්‍රි,ව 1932 වර්ෂයේ ඉදිකරන ලද ආරුක්කු හයකින් යුත් කළුගලින් නිමකරන ලද පාලමකි. මෙය මී වතුර පාලම ලෙස හඳුන්වන අතර මෙහි පාදම සඳහා හොර දැව යොදාගත් බව ජනප්‍රවාදයක් පවතී.

පේරාදෙණිය සිට දෙල්තොට දක්වා ඉදිවුණු මාර්ගයේ දුම්රිය මාර්ගයට ඉහළින් තනි ආරුක්කුවකින් යුත් කළුගලින් කරන ලද පාලමක් වන අතර එය දිගින් මීටර් 6.78කින් හා පළලින් මීටර් 8.84කින් යුක්ත වේ. එම මාර්ගයේම පේරාදෙණිය විශ්වවිද්‍යාලය හරහා ගලා යන ඇල මාර්ගයක් හරහා ආරුක්කු තුනකින් යුත් සැකසූ ගල් කුට්ටි යොදාගෙන මීටර් 9.25ක දිගකින් හා මීටර් 9.15ක පමණ පළලකින් යුක්ත පාලමකි. එම පාලමේ දෙපස ගජසිංහ රුව කැටයම් කර ඇති බැවින් ගජසිංහ පාලම නමින් සඳහන් කර ඇත. සර් අයිවර් ජෙනීන් විසින් මෙම පාලම නිර්මාණය කරන්නට ඇතැයි සැලකෙන අතර පාලම ඉහළ වර්ෂා ජලය එකතු වන විට එම ජල ඉවත් කිරීමට හින්දු දේවාලවල පවතින



ඡායාරූපය අංක 03 - ගජසිංහ පාලම



ඡායාරූපය අංක 04 - හල් ඔය පාලම

කලාත්මක හැඩයෙන් යුත් ගල් කැටයමක් යුත් නල කිහිපයක් වේ (පී. ජයසූරිය මහතා සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරෙනි) (ඡායාරූපය අංක 03). එම මාර්ගයේ ගල් ඔය හරහා ක්‍රි.ව 1940 වර්ෂයේ ඉදිකරන ලද තනි ආරුක්කුවකින් යුත් පාලමක් වන අතර එය ගඩොල් හා ගලින් නිම කරන ලද දිගින් මීටර් 8.58ක් හා පළලින් මීටර් 06ක් වන පාලමකි. එම පාලමට ආසන්නයේ හල් ඔය හරහා ක්‍රි.ව 1940 වර්ෂයේ කෝණ පාලම නමින් හැඳින්වෙන අශ්ව ලාඩම් බෝක්කු තුනකින් යුත් පාලමකි (ඡායාරූපය අංක 04). වාරියගල ප්‍රදේශයේ ද කළුගලින් ඉදිකළ එක් ආරුක්කුවක් සහිත පාලමක් වන අතර එය දිගින් මීටර් 14.36ක් වේ.

ක්‍රි.ව 1936 වර්ෂයේදී ඕවිස්ස ඔය හරහා පරායණ දෙකකින් යුත් දිග මීටර් 17ක් හා පළල මීටර් 4.13ක් වන පාලමක් ඉදිකරන ලදී. පේරාදෙණිය උද්භිද උද්‍යානයේ සිට පැරණි කුරුණෑගල මාර්ගය යාකරමින් මහවැලි ගංගාව හරහා ක්‍රි.ව 1931 වර්ෂයේදී අඩි 127ක් දිග අවලම්භිත පාලමක් (Suspension bridge) ඉදිකරන ලදී. ක්‍රි.ව 1939 වර්ෂයේදී මහවැලි ගංගාව හරහා දොඩම්වල තොටුපොළ ආසන්නයෙන් දොඩම්වල හා හල්ඔලුව යාකරමින් සංගිලි පාලමක් ඉදිකරන ලද අතර එය අඩි 150ක දිගින් යුක්ත වේ. රජයේ වැඩ දෙපාර්තමේන්තුව විසින් ඉදිකරන ලද මෙම පාලම එච්. කෙනත් ද ක්‍රෙස්ටර්, ඔස්කාර්, ටී. නෙමල්ටන් සහ ඩී.ඒ පීරිස් මෙම සංගිලි පාලම ඉදිකිරීමේ ඉංජිනේරුවන් වේ ( ජයසිංහ 2021: 45). මීට අමතරව වතු ආශ්‍රිතව අඩිපාරවල් සම්බන්ධ කරමින් වානේ අවලම්බිත පාලම් කිහිපයක් දක්නට ලැබේ.

**2.2 දුම්රිය**

ක්‍රි.ව 1867 වර්ෂයේ අගෝස්තු 01 වන දින පොල්ගහවෙල සිට මහනුවර දක්වා දුම්රිය මාර්ගය දීර්ඝ කළ අතර, ක්‍රි.ව 1874 වර්ෂය වන විට පේරාදෙණිය සිට නාවලපිටිය දක්වාත්, ක්‍රි.ව 1880 වර්ෂයේ ඔක්තෝබර් මස 04 වන දින මහනුවර - මාතලේ දක්වාත් දුම්රිය මාර්ගය දීර්ඝ කිරීමත් වැවිලි කර්මාන්තය හේතුකොටගෙන සිදුවිය. මහනුවර සිට මාතලේ හා නාවලපිටිය දක්වා දුම්රිය මාර්ගය ඉදිකිරීමේදී අධික කඳු සහිත භූ විෂමතාවන් සහිත වුවත් එම දුෂ්කරතා මඟහරවාගෙන දුම්රිය මාර්ග පද්ධතිය රොබින්සන් හා ජේම්ස් ආර් ලෝඩ්න් ආණ්ඩුකාරවරුන්ගේ සමයන්හි සිදුවිය (Cave 2002:117). මහනුවර සිට ගම්පොළ දක්වා දුම්රිය මාර්ගය ඉදිකිරීම සඳහා රීඩ් සහ මයිකල් සමාගමට පැවරුණු අතර මාතලේ මාර්ගය ඩේවිඩ් රීඩ් සමාගම විසින් ඉදිකරන ලදී.

මහනුවර දිස්ත්‍රික්කය තුළ පවතින පැරණි දුම්රිය ස්ථාන ලෙස කඩුගන්නාව, පේරාදෙණිය , සරසවි උයන, මහනුවර, මහයියාව, කටුගස්තොට, උඩතලවින්න, වත්තේගම, ගම්පොළ, උලපනේ හා නාවලපිටිය දැක්විය හැකි අතර, 19 වන සියවස හා 20 වන සියවසට අයත් වන මෙම ඉදිකිරීම්වල ආරුක්කු සහිත දොර ජනෙල්, කොරින්තියානු කුලුණු මෙන්ම වෙනත් කුලුණු හා සැරසිලි සහිත යකඩ බාල්ක වලින් යුක්ත වේ. ක්‍රි.ව 1867 වර්ෂයේ පැරණි පේරාදෙණිය දුම්රිය ස්ථානය ඉදිකරන ලද අතර එය දිගින් මීටර් 11.50ක් හා පළලින් මීටර් 6.90ක් පමණ වේ. පුළුල් කාමර දෙකකින් සමන්විත වන මෙම


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ගොඩනැගිල්ල වටා ආලින්දයකින් යුක්ත වේ. පැරණි ගොඩනැගිල්ලෙහි බිත්ති ගල් හා හුණුගල් භාවිතා කර හුණු ආලේප කර ඉදිකර ඇත (ඡායාරූපය අංක 05). උඩරට ප්‍රදේශවල වැවිලි කර්මාන්ත කටයුතු සිදුකිරීමත් සමඟ එම අස්වනු ගබඩා කර තැබීම සඳහා මෙන්ම වගාවන්ට අවශ්‍ය පොහොර හා වතුවල ජීවත් වූ කම්කරුවන්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගබඩා කරතැබීම සඳහා කළුගල් හා ගඩොල් භාවිතා කරමින් ඉදිකරන ලද ගබඩා ගොඩනැගිලි කඩුගන්නාව, මහනුවර, කටුගස්තොට (ඡායාරූපය අංක 06), වත්තේගම, උලපනේ හා නාවලපිටිය දුම්රිය ස්ථාන සතුවන අතර එම ගොඩනැගිලිවල ආරුක්කුමය දොර ජනෙල් හා වා කවුළු වලින් යුක්ත වේ.



ඡායාරූපය අංක 05 - පැරණි පේරාදෙණිය දුම්රිය ස්ථානය



ඡායාරූපය අංක 06 - කටුගස්තොට ගබඩා ගොඩනැගිල්ල

උඩරට දුම්රිය මාර්ගයේ හා මාතලේ මාර්ගයේ ධාවනය වූ දුම්රියන් නඩත්තු කිරීම හා ගාල් කර තැබීම සඳහා දුම්රිය ධාවනාගාර කිහිපයක් කඩුගන්නාව, මහනුවර හා නාවලපිටිය යන දුම්රිය ස්ථානවල වන අතර අද වන විට භාවිතා වන්නේ මහනුවර දුම්රිය ස්ථානයේ ධාවනාගාරය පමණි. මහනුවර ධාවනාගාරය තුළ ගල්අඟුරු දාහක උඳුනක් වේ. කඩුගන්නාව දුම්රිය ස්ථානය සතුව පවතින ධාවනාගාරය ක්‍රි.ව 1890 වර්ෂයේ කළුගලින් ඉදිකරන ලද අතර දිගින් මීටර් 68.60ක් සහ පළලින් මීටර් 13.30ක් වේ. කඩුගන්නාව දුම්රිය ධාවනාගාරයේ එකවැර A පන්තියේ ලෝකොමොටිව් දුම්රිය එන්ජින් හතරක් ගාල් කර තැබීමට හැකිවූ බව වාර්තාවල සඳහන් වේ. මෙහි දුම්රිය එන්ජින් රියදුරන් අටදෙනෙකු හා එක් ෆෝර්මන්වරයෙකුගෙන් සමන්විත වූ බව සඳහන් වන අතර ක්‍රි.ව. 1975 වර්ෂයේ මෙම ධාවනාගාරය වසා දමා පසුකාලීනව පොහොර ගබඩාවක් ලෙස භාවිතයට ගන්නා ලදී. ක්‍රි.ව 1867 වර්ෂයේ ඉදිකරන ලද බ්‍රිතාන්‍යයන් හට විවේක සුවයෙන් සිටීමට, බිලියඩ් වැනි ක්‍රීඩාවන්වල නිරතවීමට හා මත්පැන් පානය කිරීමට අවශ්‍ය පහසුකම් සහිත සමාජ ආයතන ගොඩනැගිල්ලක් කඩුගන්නාව දුම්රිය ස්ථානය සතු වේ. ආරුක්කු හැඩති දොර ජනෙල් හා වා කවුළු වලින් යුත් මෙම ගොඩනැගිල්ල ඉදිරිපස කුලුණු කිහිපයකින් යුත් දිගු ආලින්දයකින් (Colonial Verenda) සමන්විත වේ. මෙම ගොඩනැගිල්ල ගඩොල් හා කළුගල් යොදාගෙන තනා ඇති අතර මෙම සමාජ ආයතනයට ආසන්නයෙන් ක්‍රි.ව 1887 වර්ෂයේ ඉදිකරන්නට ඇතැයි සැලකෙන ටෙනිස් පිටියක් ද වේ. මීට අමතරව මෙම දුම්රිය ස්ථාන ආශ්‍රිතව බංගලා, වෙඩි බෙහෙත් ගබඩා, සංඥා කුලුණු, වාත්තු යකඩින් කළ මාර්ග සංඥා, පැරණි ලාම්පු, පැරණි දැවමය පුටු, පැරණි ඔරලෝසු, මුදල් සේප්පු, විදුලි පණිවිඩ කණු, පැරණි පහන් කණු හා වාත්තු යකඩින් කළ ජල බේසම් වලින් යුක්තය.

දුම්රිය එන්ජින් හැරවීම සඳහා ස්ථාපනය කරන ලද හැරවුම් ආවර්තනය (Turn Table) මහනුවර, ගම්පොළ හා නාවලපිටිය යන දුම්රිය ස්ථානවල පවතින අතර මෙම හැරවුම් පීඨිකා යන්ත්‍ර නිෂ්පාදනය කර ඇත්තේ Cowans Sheldo & Co Ltd යන සමාගම විසිනි. කඩුගන්නාව දුම්රිය ස්ථානය සතුව හැරවුම් පීඨිකාවක් තිබී ඇති අතර එය අඩි 45ක් පමණ දිගින් යුක්ත බව සඳහන් වේ (ජයසිංහ 2022: 06). එය ක්‍රි.ව 1894 වර්ෂයේ සවිකරන ලද බවත් ක්‍රි.ව 1975 වර්ෂයේ නානුඔය දුම්රිය ස්ථානය වෙත ගෙන ගිය බව වාර්තා කර ඇත. වාෂ්ප බල දුම්රිය එන්ජින් ධාවනය කිරීමට අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා කඩුගන්නාව හා වත්තේගම යන දුම්රිය ස්ථාන ආශ්‍රිතව ස්වභාවික ජල උල්පත් ආශ්‍රය කරගනිමින් නිර්මාණය කරන ලද කුඩා ළිං සමූහයක් වේ. මෙම ළිං මගින් ජල නල ඔස්සේ ජල ස්ථම්භ හා ජල පයිප්ප වලට ජල සැපයුම් කළ බව අනාවරණය වේ. මීට අමතරව දුම්රිය උරුම හා සැබැඳි ඉදිකිරීම් හා උපකරණ රැසක් මහනුවර හා තදාශ්‍රිතයේ පවතින දුම්රිය ස්ථාන සතුවේ. ඒ අතර ජල ටැංකි, ජල පයිප්ප, දුම්රිය ගේට්ටු, දොඹකර, පැරණි තරාදි, පැරණි දුරකථන, ටැබ්ලට් යන්ත්‍ර, පිලී මාරු කරන පයින්ටු හා ලීවර හා සංඥා ක්‍රම සුවිශේෂි වේ. මෙම කාර්මික උරුමයන් සියල්ලක්ම බ්‍රිතාන්‍යයේ විවිධ සමාගම්වල නිෂ්පාදනය කර ලංකාවට ගෙන්වන ලද ඒවා බව හඳුනාගත හැකිය.

| යන්ත්‍රය / උපකරණය | තිබිරි ස්ථානය | නිෂ්පාදන ආයතනය |
|---|---|---|
| ජල ටැංකි | කඩුගන්නාව<br>මහනුවර<br>නාවලපිටිය | Cowans Smart Co Ltd (1901)<br>Foundery Engineers |
| ජල පයිප්ප | කඩුගන්නාව<br>මහනුවර<br>නාවලපිටිය | WM Wini Abell Ltd |
| දුම්රිය ගේට්ටු | කඩුගන්නාව<br>වත්තේගම<br>(යටිරාවණ) | WB & Co (1911) |
| දොඹකර | කඩුගන්නාව<br>සරසවි උයන<br>මහනුවර<br>වත්තේගම | Ransomes & Rapier (1937)<br>Cowans Sheldon Co Ltd |
| පැරණි තරාදි | කඩුගන්නාව<br>පේරාදෙණිය<br>සරසවි උයන<br>මහනුවර | H. Pooley & Co Ltd<br>W & T Avery Makers |
| පැරණි දුරකථන | කටුගස්තොට<br>උඩතලවින්න | Western Electric (1881)<br>GCE Phone |
| ටැබ්ලට් යන්ත්‍ර | කටුගස්තොට | Tyer's Patent Train Tablet Apparatus |
| පිලී මාරු කරන පයින්ටු | වත්තේගම | WB & S Co |
| ලීවර හා සංඥා ක්‍රම | කඩුගන්නාව | Railway Signal Co Ltd<br>The Westinhouse Brake & Saxby Signal Co Ltd |

වගු අංක 01 - දුම්රිය ප්‍රවාහනය සම්බන්ධ බ්‍රිතාන්‍යයේ විවිධ සමාගම්වල නිෂ්පාදිත යන්ත්‍ර / උපකරණ

තවද මෙම දුම්රිය ස්ථානවල පැරණි මඟී ගුවන් පාලම්, වෝකර්ස් හා පුත්‍ර සමාගමේ නිෂ්පාදිත බ්‍රේක් වෙට්ස් යකඩ බෝල හා ප්‍රවේශ පත්‍ර නිකුත් කරන යන්ත්‍ර වේ. තවද දුම්රිය මැදිරි අංගනගත කිරීමට (Shunting) යොදාගත් Y පන්තියේ එන්ජිමක් මහනුවර හා නාවලපිටිය දුම්රිය ස්ථාන සතුය. මීට අමතරව කුඩා මෝටර් ට්‍රොලි හා භාණ්ඩ ප්‍රවාහන පෙට්ටි දක්නට ලැබේ.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

19 හා 20 වන සියවස්වලට අයත් වන උළුවම් ආරුක්කු පාලම්, යකඩ ග්‍රේඩර් පාලම් හා ගඩොල් බෝක්කු (Culverts) කිහිපයක් මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශවල දක්නට ලැබේ. පිළිමතලාව කිරිබත්කුඹුර දුම්රිය හරස් මාර්ගය ආශ්‍රිතව නානුඔය හරහා ගඩොලින් නිර්මාණය කරන ලද අඩි 30යි අඟල් 15ක පමණ දිගකින් හා අඩි 15ක් උසින් යුක්ත ගඩොල් ආරුක්කු පාලම හිරගලක් යොදාගෙන ආරුක්කුව ශක්තිමත් කර ඇත. මීට අමතරව ක්‍රි.ව 1914 වර්ෂයේ මාතලේ මාර්ගයේ කටුගස්තොට පාර උප දුම්රිය ස්ථානය ආශ්‍රිතව ගඩොලින් තනන ලද අශ්ව ලාඩම් හැඩති බෝක්කුවක් නිර්මාණය කළ අතර එය 2011 වර්ෂයේ නායයෑමකට ලක්ව විනාශ විය (Manatunga 2017: 4). මාතලේ දුම්රිය මාර්ගයට පහළින් ක්‍රි.ව 1878 - 1880 යන කාලපරිච්ඡේදයන් තුළ අර්ධ කවාකාර ආරුක්කු හැඩැති ගඩොලින් කළ බෝක්කු දෙකක් මහයියාව හා නිත්තවෙල ප්‍රදේශයේ දක්නට ලැබේ. මෙම ගඩොල් බෝක්කු උස අඩි 16කින් යුක්ත වේ (ඡායාරූපය අංක 07).



ඡායාරූපය අංක 07 - මහයියාව ගඩොල් බෝක්කුව

බ්‍රිතාන්‍යයන් විසින් කඩුගන්නාව ප්‍රදේශයේ නානුඔය හරහා තඹහිටියාව පාලම ඉදිකරන ලද අතර එය එංගලන්තයේ වෙන්ස්බර්ග්හි Patant Shaft & Axilenee Company Ltd නම් සමාගම විසින් නිෂ්පාදනය කරන ලද්දකි (Kodithuwakku 1997: 25). පේරාදෙණිය දුම්රිය ස්ථානයට ආසන්නයෙන් ගලා බසින මහවැලි ගංගාව හරහා යකඩ පාලමක් ඉදිවිය. තනි කළුගලින් නිමවූ ශක්තිමත් කුලුණු තුනක් මත රැඳවුණු අඩි 109කින් ද, අඩි 60ක පරායණ දෙකකින් සමන්විත වූ මෙම පාලම අඩි 347ක දිගින් යුක්ත වේ. ඉහළ ආරුක්කු 08කින් හා පැටි කාප්ප වලින් යුක්තව මෙම පාලම ඉදිකරන ලදී. ක්‍රි.ව 1960 වර්ෂයේදී දංගොල්ල මාර්ගයට ඉහළින් එංගලන්තයේ ග්ලැස්කෝව්හි R & W Maclellan Limited Clutha Works නම් සමාගම විසින් නිෂ්පාදනය කරන ලද පාලමක් දුම්රිය මාර්ගයට සවිකරන ලදී. වඩුගොඩපිටිය වීදිය හා අස්ගිරිය මාර්ගය යාකරමින් මාතලේ දුම්රිය මාර්ගයට ඉහළින් කැටයම් කරන ලද අත්වැටවල් හා බාල්ක සහිත යකඩින් කරන ලද පාලමක් වේ. කටුගස්තොට ප්‍රදේශයෙන් ද මහවැලි ගංගාව හරහා අඩි 632කින් යුත් ඉහළ ආරුක්කු සහිත පැට්‍රි කාප්ප වලින් යුත් පාලම Westwood Baillie & Co සමාගම විසින් නිෂ්පාදනය කරන ලදි (ඡායාරූපය අංක 08). යටිරාවණ දුම්රිය හරස් මාර්ගය ආසන්නයේ ද Westwood Baillie & Co සමාගම විසින් නිෂ්පාදිත පාලමක් වේ (ඡායාරූපය අංක 09). ගම්පොළ සිට නාවලපිටිය දක්වා දුම්රිය මාර්ගය ඉදිවන විය කිරිපැණි ඔය හරහා ආරුක්කුවක් සහිත පාලමක් ඉදිවිය (Ceylon 1864: 24). මීට අමතරව කැගලු ඔය, උලපනේ ඔය හා මහවැලි ගංගාව හරහා යකඩ ග්‍රේඩර් පාලම් ඉදිවිය.



ඡායාරූපය අංක 08 - කටුගස්තොට දුම්රිය පාලම

උඩරට දුම්රිය මාර්ග ඉදිකිරීමේදී පැවති භූ විෂමතාවන් හේතුවෙන් දුම්රිය මාර්ගය ඉදිකිරීම අපහසු වුවත් කඳු හා පර්වත හාරා බිම්ගෙවල් නිර්මාණය කිරීමට කටයුතු කළහ. කඩුගන්නාව දුම්රිය ස්ථානයට ආසන්නව අඩි 85ක් වන අංක 11 බිම්ගෙය පිහිටි ස්වභාවික ගලෙහිම නිර්මාණය කරන ලද බිම්ගෙයක් වේ. මාතලේ මාර්ගයේ ද අශ්ව ලාඩම් හැඩති බිම්ගෙයක් බ්‍රිතාන්‍යයන් විසින් නිර්මාණය කරන ලදී.



ඡායාරූපය අංක 09 - යටිරාවණ පාලම

### 2.3 රථ වාහන

මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයේ වැවිලි කර්මාන්ත කටයුතු දියුණුවත් සමඟ වතු ආශ්‍රිතව බිහිවූ නව ධනේශ්වර පන්තියට ගමන් බිමන් යාම සඳහා මෝටර රථ ගෙන්වන ලදී. මහනුවර දිස්ත්‍රික්කයට “D” අක්ෂරයෙනුත්, මහනුවර නගර සභා බල ප්‍රදේශය සඳහා “G” අක්ෂරය යොදාගෙන ක්‍රි.ව 1928 වර්ෂය පමණ වන විට මෝටර රථ ලියාපදිංචි කරනු ලැබිණ (Akbarali 2013: 10). ක්‍රි.ව 1940 වර්ෂය වන විට මෙම ක්‍රමය වෙනස් කර ශ්‍රී ලංකාව ඉංග්‍රීසි භාෂාවෙන් හැඳින්වූ CEYLON යන නාමය අනුව අකුරු ගලපා සකස් කරන ලදී. මෙම ප්‍රදේශවල ජීවත් වූ මධ්‍යම පාන්තික වෛද්‍යවරු, විදුහල්පතිවරු, ගුරුවරු හා වතු අධිකාරිවරු වැනි සේවාවල නියුක්ත වූවන් මෝටර රථ භාවිතා කරන ලදී. ඔස්ටින්, මොරිස් මයිනර්, මොරිස් එයිට්, ෆියට් හා ෆෝඩ් වැනි මෝටර් රථ මෙම ප්‍රදේශවල භාවිතා වූ බව සඳහන් වේ (Akbarali 2013: 45). තවද ජානිස් සිල්වා, මැන්ටි, ඒ. ජී ප්‍රානාන්දු හා සී. බී ගාර්ඩින් සතුව මහනුවර හා වත්තේගම ප්‍රදේශවල බස් හා ලොරි රථ සේවාවන් තිබී ඇත.

### 03. සන්නිවේදන

ක්‍රි.ව 1832 වර්ෂයේ අශ්ව කෝච්චි සේවයක් ආරම්භ කරන ලද අතර බ්‍රිතාන්‍යයන්ගේ පහසුව සලකා තැපැල් හා මගී ප්‍රවහන කටයුතු සඳහා මෙම සේවය යොදාගනු ලැබීය. මෙරට ආරම්භ කරන ලද ප්‍රථම අශ්ව කෝච්චි


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

සේවය කොළඹ - මහනුවර දක්වා සිදුවූ අතර එය ආසියාවේ පළමුවන අශ්ව කෝච්චි සේවයයි. ක්‍රි.ව 1892 වර්ෂයේදී කොළඹ කොටුව හා පේරාදෙණිය අතර පළමු තැපැල් දුම්රිය සේවයක් සිදු අතර එය වඩාත් ජනප්‍රිය වූ බැවින් ක්‍රි.ව 1932 වර්ෂය වන විට මහනුවර දක්වා එම සේවය දීර්ඝ කරන ලදී. ක්‍රි.ව 1858 වන විට දුරකථන සේවයක් කොළඹ සිට මහනුවර දක්වා ඇති කරනු ලැබිණ. ක්‍රි.ව 1859 වන විට එවකට පැවති විදුලි සංදේශන ක්‍රමය වෙනුවට මොරස් නැමති නව ක්‍රමයක් හඳුන්වා දුන් පසුව මහනුවර අවට එම ක්‍රමය ස්ථාපිත විය. (මද්දුම බණ්ඩාර 2018: 56). ඉන් පසුව මහනුවර ප්‍රදේශයේ ක්‍රි.ව 1936 වන විට ටෙලි ප්‍රින්ටර් සේවයක් හා එය ක්‍රි.ව 1938 වර්ෂය වන විට පණිවිඩ හුවමාරු කිරීමේ ස්වයංක්‍රීය ක්‍රමයක් බවට පත්විය.

පළමු පොස්ට් මාස්ටර් ජනරාල් ඇන්තනී බාටොච්චි කලාම් විසින් ක්‍රි.ව 1896 වර්ෂයේ වත්තේගම දුම්රිය ස්ථානයට දුම්රිය මඟින් ගෙන ආ තැපැල් මළු ලබාගෙන "රිසීවින් ඔෆිස්" නම් කුඩා තැපැල් කාර්යාලය වෙත ගෙන ගිය බව සඳහන් වේ. එම තැපැල් කාර්යාලයේ සිට වත්තේගම ආසන්නයේ වූ පන්විල, ඇල්කඩුව, කබරගල හා කැලෑබොක්ක ආදී ප්‍රදේශවලට "රනර්" නම් පයින් ඇවිදගෙන යන සීනුවක් බැඳි සැරයටියකින් යුත් තැපැල්කරුවන් යොදා සිටි බව සඳහන් වේ. මෙම ක්‍රමය වර්තමානය වන විටත් කබරගල තවලන්තැන්න තැපැල් කාර්යාලයේ සිට නකල්ස් අඩවියේ පහළ එනසාල් වතු දක්වා ක්‍රියාත්මක වේ. Station Garden Hotel නමින් හැඳින්වූ බ්‍රිතාන්‍යය නිලධාරීන් විවේකීව සිටි ගොඩනැගිල්ල ක්‍රි.ව 1902 වර්ෂයේ මහනුවර තැපැල් කාර්යාල ගොඩනැගිල්ල බවට පත්විය. මෙම ගොඩනැගිල්ල වික්ටෝරියානු වාස්තු විද්‍යාවට අනුව නිර්මාණය වූ අතර, ආරුක්කු හැඩති දොර ජනෙල්, වාත්තු යකඩින් කළ සැරසිලි වලින් යුක්තය. ඊට අමතරව මෙහි අශ්වයින් ගාල් කර තැබීම සඳහා පැවති ස්තාලයක නටබුන් වේ. මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශවල තැපැල් කාර්යාල බොහෝමයක් කළුගල්වලින් හා දැව යොදාගෙන නිමකර ඇත. මෙම තැපැල් කාර්යාල ආශ්‍රිතව අදවන විටත් විවිධ කාර්මික උපකරණ ශේෂ වී ඇත.

| යන්ත්‍රය / උපකරණය | පිහිටි ස්ථානය | නිෂ්පාදන ආයතනය |
|---|---|---|
| [illegible] රථ | මහනුවර | විටෝල් සමාගම (1883) |
| මුදල් සේප්පු | මහනුවර<br>කටුගස්තොට | Milners Patent |
| තරාදි | මහනුවර | F.J. Johnton & Co Ltd (1922)<br>Salted Letter Balance |
| දුරකථන | මහනුවර<br>කටුගන්නාව | Western Electric (1881)<br>GCE Phone |
| සෙරමික් ජල පෙරණ උපකරණ | ගලගෙදර | The Berkefeld Filter Co |

වගු අංක 02 - තැපැල් කාර්යාල ආශ්‍රිතව පවතින බ්‍රිතාන්‍යයේ විවිධ සමාගම්වල නිෂ්පාදිත උපකරණ

19 වන සියවසේ අගභාගය වන විට ලංකාවේ තැපැල් පෙට්ටි භාවිතා කරන ලද අතර මුල්වරට ඉදිකරන ලද තැපැල් පෙට්ටියක් මහනුවර නගරයේ ස්ථාපිත කර තිබූ අතර වර්තමානයේදී එය දක්නට නොමැත. වාත්තු යකඩින් නිර්මාණය කරන ලද පැරණි තැපැල් පෙට්ටි වික්ටෝරියා රැජිනගේ පාලන සමයට අයත් බැවින් කලාත්මක ලක්ෂණ වලින් යුක්තය (Kodithuwakku 2004: 33). එම තැපැල් පෙට්ටිවල ශීර්ෂය නිර්මාණාත්මක පොහොට්ටු හැඩයක් ගනු ලැබිණ. එහෙත් ශ්‍රී ලංකාවේ මුල්ම තැපැල් පෙට්ටි සීනු හැඩ සහිත ගෝලාකාර මුදුනකින් යුක්ත විය.

| තැපැල් පෙට්ටි | පිහිටි ස්ථානය | නිෂ්පාදන ආයතනය |
|---|---|---|
| V ජෝර්ජ් රජුගේ පාලන සමය (ඡායාරූපය අංක 10) | ගලගෙදර<br>හන්තාන | Telegram Workshop Colombo (1929) |
| VI ජෝර්ජ් රජුගේ පාලන සමය | [illegible]<br>පිළිමතලාව<br>කටුගස්තොට<br>කටුගන්නාව | Government Factory (1939) |
| VI ජෝර්ජ් රජුගේ පාලන සමය (සිලින්ඩරාකාර තැපැල් පෙට්ටි) (ඡායාරූපය අංක 11) | පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br>[illegible]<br>කටුගස්තොට | Government Factory |
| එල්ලන ලද තැපැල් පෙට්ටි | මහනුවර | W.T. Allen & Co |

වගු අංක 03 - බ්‍රිතාන්‍යයේ හා ලංකාවේ විවිධ සමාගම්වල නිෂ්පාදිත තැපැල් පෙට්ටි




ඡායාරූපය අංක 10 - ගලගෙදර තැපැල් පෙට්ටිය




ඡායාරූපය අංක 11 - පේරාදෙණිය විශ්වවිද්‍යාලය තැපැල් පෙට්ටිය

## 04. පොදු පහසුකම් හා වෙනත් නිර්මාණ

පොදු පහසුකම් හා වෙනත් නිර්මාණ යටතට අයත් වන කාර්මික උරුම රැසක් මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශය තුළ දක්නට ලැබේ. මහනුවර පත්තිනි දේවාලය ආසන්නයේ ක්‍රි.ව 1875 වර්ෂයේ දෙසැම්බර් මස කෝපි වගා කටයුතු නැරඹීම සඳහා පැමිණි එච්. ආර්. එච්. වේල්ස් කුමරු පැමිණීම සිහිවීම පිණිස වාත්තු යකඩින් ස්මාරකයක් නිමවන ලදී. මෙම වතුර මල නිමවන ලද්දේ ග්ලැස්ගෝහි George Smith & Co නම් සමාගමක් විසිනි (ඡායාරූපය අංක 12). මීට අමතරව මහනුවර වේල්ස් උද්‍යානයේ වාත්තු යකඩින් කළ ස්මාරකයක් ද , මහනුවර හැටන් නැෂනල් බැංකුව ඉදිරිපිට වාත්තු යකඩින් කළ සැරසිලි ද දක්නට ලැබේ. දේශීය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මුසුකරගනිමින් ක්‍රි.ව 1947 වර්ෂයේ අගෝස්තු



ඡායාරූපය අංක 12 - වතුර මල


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

මස 14 වන දින කඩුගන්නාවේදී ජීවිතයෙන් සමුගත් මොහොමඩ් සැකී ඉස්මයිල් සිහිවීම පිණිස හාජි මොහොමඩ් ඉස්මයිල් විසින් මහනුවර නගරයට ඔරලෝසු කණුවක් දේශීය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මුසු කරමින් (Clock Tower) නිර්මාණය කිරීමට කටයුතු කර ඇත (ඡායාරූපය අංක 13). පේරාදෙණිය උද්භිද උද්‍යානය තුළ බ්‍රිතාන්‍යයන් විසින් ජල පහසුකම් ලබා ගැනීම සඳහා Glenfield Kennedy Kilmarnock නම් සමාගම විසින් නිෂ්පාදිත ජල කරාම රැසක් ස්ථාපිත කර ඇත. මීට අමතරව හිටි ජල පයිප්ප කිහිපයක් නාවලපිටිය නගරයේ පැවති අතර එම පයිප්ප බ්‍රිතාන්‍යයේ නිෂ්පාදිතය (Kodithuwakku 2004: 35).



ඡායාරූපය අංක 13 - මහනුවර ඔරලෝසු කනුව

වාෂ්ප බලයෙන් ක්‍රියාකරනු ලැබූ එහා මෙහා ගෙනගිය හැකි (Portable) බලශක්ති උත්පාදක යන්ත්‍රයක් මහනුවර ටයර් වෙළඳසලක් සතුව පවතින අතර එය ජයන්ස්බර්ග්හි Marshall Sons & Co නම් සමාගම විසින් නිෂ්පාදිතය (ඡායාරූපය අංක 14). පූජාපිටිය පලීපාන දයා මුද්‍රණාලයෙහි ලන්ඩනයේ නිෂ්පාදිත Harrid & Sons Works නම් සමාගමෙහි වූ මෙරටට ගෙන්වන ලද පැරණි මුද්‍රණ යන්ත්‍ර කිහිපයක් වේ. මීට අමතරව බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාවට අනුකූලව නිර්මාණය කරන ලද 19 හා 20 වන සියවස්වලට අයත් වන ගොඩනැගිලි මහනුවර නගරය තුළ වේ. මහනුවර තැපැල් කාර්යාල ගොඩනැගිල්ල (ඡායාරූපය අංක 15), මහනුවර රැජින හෝටලය,



ඡායාරූපය අංක 14 - බලශක්ති උත්පාදක යන්ත්‍රය



ඡායාරූපය අංක 15 - මහනුවර තැපැල් කාර්යාල ගොඩනැගිල්ල

කාර්ගිල්ස් ගොඩනැගිල්ල, පැරණි උසාවිය, ලංකා බැංකු ගොඩනැගිල්ල ඇතුළු රාජ්‍ය හා පෞද්ගලික ගොඩනැගිලි රැසක් නගරය තුළ ස්ථාපිතය. වත්තේගම හා කඩියන්ලෙන වැනි වතු ආශ්‍රිත කුඩා නගරවල සොල්දර සහිත නිවාස හා කඩවල් අදටත් ශේෂ වී ඇත.

## 04. සමාලෝචනය

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමය තුළ කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 1815 - 1948 අතර කාලපරිච්ඡේදය තුළ මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශය ආශ්‍රිතව සිටි ගැමි සම්ප්‍රදායික සංස්කෘතියකට ගොඩනැංවුණු සමාජයට නූතන කාර්මික උරුමයන් වූ ප්‍රවාහන, සන්නිවේදන, වැවිලි කර්මාන්තය හා පොදු පහසුකම් ආශ්‍රිතව සිවිල් ඉංජිනේරුමය හා යාන්ත්‍රික තාක්ෂණික උරුමයන් පැමිණීම හේතුවෙන් ඔවුන්ගේ සමාජය පරිවර්තනාත්මක වෙනසකට මුහුණ දුන් අතර එලෙස බ්‍රිතාන්‍යයන් විසින් දායාද කළ කාර්මික උරුමයන් මෙම පර්යේෂණය මගින් අනාවරණය විය. මෙම කාර්මික උරුම මහනුවර ප්‍රදේශයේ ස්ථාපිත වීමට වැවිලි කර්මාන්තය හේතුවූ බව මෙමගින් තහවුරු වූ අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඇතුළු වගකිව යුතු ආයතන හා බලධාරීන් නිසිලෙස දැනුවත් නොවීම නිසාවෙන් වර්තමානය වන විට බොහෝ කාර්මික උරුමයන් විනාශ වී යමින් පවතී. පුරාවිද්‍යා පනතට අනුව වසර සියය ඉක්මවූ කාර්මික උරුමයන් මහනුවර හා තදාශ්‍රිත ප්‍රදේශයන්වල පවතින බැවින් එම උරුම පුරාවිද්‍යා ස්ථාන හා පුරාවස්තූන් බවට පත්කළ යුතු බව මෙම පර්යේෂණය තුළින් යෝජනා කරයි.

## උපකාරානුස්මෘතිය

වත්මන් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්තුමා වන මහාචාර්ය අනුර මනතුංග මහතාට, කැලණිය විශ්වවිද්‍යාලයේ හිටපු අංශාධිපතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයට, දුම්රිය දෙපාර්තුමේන්තුවේ නිලධාරීන්ට, මහනුවර මහාමාර්ග හා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරින්ට, මධ්‍යම නියෝජ්‍ය තැපැල්පතිතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට, මහනුවර පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුවේ හා මධ්‍යම සංස්කෘතික අරමුදලේ නිලධාරීන්ට, මහනුවර ලේඛනාගාරයේ නිලධාරීන්ට, තේ කර්මාන්තශාලා හිමියන්ට, මහනුවර මෝටර් රථ හිමිකරුවන්ට, මාගේ දෙමාපියන්ට හා නන් අයුරින් උපකාර කළ සැමට මෙම ලේඛකයාගේ කෘතවේදීත්වය හිමිවේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

ජයවර්ධන, එස්. කේ. (2014) "වත්තේගම සැඟවුණු තොරතුරු", නවරත්න ප්‍රින්ටර්ස්, වත්තේගම.

ජයසිංහ, විශ්ව ශ්‍රී. (2022) "මධ්‍යම පළාත ආශ්‍රිත සමාජ - ආර්ථික ක්ෂේත්‍රයන්ට බලපෑ යටත් විජිත සමයේ ඉදිවූ දුම්රිය ස්මාරක", සාරථී 2022, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත.

ජයසිංහ, විශ්ව ශ්‍රී. (2022) "ශ්‍රී ලංකාවේ මහාමාර්ග ආශ්‍රිත කාර්මික ස්මාරක පිළිබඳ අධ්‍යයනයක්", රුහුණු විශ්වවිද්‍යාලීය වාර්ෂික පර්යේෂණ සමුළුව 2022, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය.



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ජයසිංහ විශ්ව ශ්‍රී. (2022) “බ්‍රිතාන්‍යය යුගයේ භාවිත කළ යන්ත්‍ර පිළිබඳ කාර්මික පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්”, දෙවන පර්යේෂණ සමුළුව, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

ද සිල්වා, ආර්. (2005) “ශ්‍රී ලංකාවේ තේ ඉතිහාසය”, සමන්ති ප්‍රකාශන, ජා ඇල.

මද්දුමබණ්ඩාර, සුනන්ද. (2018) “බ්‍රිතාන්‍යය යටත් විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය”, විද්‍යාලංකාර ප්‍රින්ටර්ස්, කැලණිය.

මුණසිංහ, ඉන්ද්‍රාණි. (2000) “ශ්‍රී ලංකාවේ මාර්ග ප්‍රවාහනය (අනුරාධපුර යුගයේ ආරම්භයේ සිට යටත් විජිත යුගය අවසානය තෙක් )”, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

Administration Reports, Ceylon in Railway for the years 1903, 1904, 1908, 1912, 1913, 1917, 1918, 1919, 1920, 1925, 1930, 1934 Ceylon Government press.

Akbarali, A. (2013) “Vintage and Classic Cars in Ceylon”, Hermitage, Colombo.

Balasingham, S. V. (1968) “The administration of Sir Henry Ward, Government of Ceylon, 1855 – 1860, Thisara Publication, Dehiwala.

Bingham, P.M. (1921) “History of the Public Works Department Ceylon (1796 – 1913) vol I”, Government Printer.

Henry, W. Cave. (1910) “Ceylon along the rail track the Ceylon Government Railway – Second edition 2002”, Visidunu Publication, Boralesgamuwa.

Jayasinghe, Vishwa Sri. (2021) “An Industrial Archaeological study of bridges built during the British period in Kandy and suburbs (Based on selected sites), Trivalent 2021, Department of Archaeology, University of Kelaniya.

Jayasinghe, Vishwa Sri. (2022) “A study of companies that produced civil engineering and mechanical technology heritage in Sri Lanka during the British period” *Yugathara* 2022, Center for Heritage studies, University of Kelaniya.

Kodithuwakku, K. (1997) “Road Bridge in Sri Lanka (1800 – 1950”), Unpublished M.A. Thesis, Postgraduate Institute of Archaeology, Colombo.

Kodithuwakku, K. (1997) “Cast Iron Stand Pipes in Matale – Dambulla Area”, Unpublished Research report.

Manathunga, S.B. (2017) “Brick made arched bridges, culverts, tunnels along the Railways in 19th Centuary Sri Lanka (Unpublished)”, University of Kelaniya.

The Ceylon Government Railway 1864 – 1964. (1964) The Ceylon Government Railway, Colombo.

**සම්මුඛ සාකච්ඡා**

පී. ජයසූරිය මහතා, ප්‍රධාන ඉංජිනේරු, 2020. 08. 06



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

The Journal of Archaeology and Heritage Studies (JAHS) 8 (I) 2021: 39 - 45

The Journal of

Archaeology & Heritage Studies

Journal Home page https://fssh.rjt.ac.lk/index.php/jahs-about/

Research Paper

# Origin of Srilankan Art: Sculptures of Frontspiece (Ayaka)

**Senarth Bandara Dissanayake** [1]

1. Former Director General of Department of Archaeology, Former President of Sri Lanka Council of Archaeologists, Former President of ICOMOS Sri Lanka (International Council on Monuments and Sites - Sri Lanka) senarathd1961@gmail.com

ARTICLE INFO

*Article History:*
Received 31 December 2022
Accepted 31 May 2023
Available online 01 October 2023

ABSTRACT

The frontspiece of a dagoda is a protrusion, projecting from next to the dome. These mark prime examples of Sri Lankan art of sculpture, decoratively depicting symbols. The fronspieces survive intact at Kantaka Chetiya in Mihintale, Mirisavetiya Dagobas and Abhayagiriya Dhakshina Stupa in Anuradhapura and Digavapi near Ampara. There are remains to be seen at Yatala Dagoba in Tissamaharama and Mangala Maha Chetiya in Seruwawila as evidence of the existence of frontspieces in the past. The eastern frontspiece is the best out of the frontspieces at Kantaka Chetya, Mihintale which, according to Dr. Senerath Paranavitana, are the most ancient of the frontspieces and belong to 1st -2nd century AD. Although these are considered the oldest sculptures in Sri Lanka, there would have been previous constructions made of perishable material like wood and clay, serving as examples to the later granite frontspieces. Most of the sculptures in the frontspieces bear a connection to the Ashta Mangala symbols which depict water, fertility and wealth. The dagoba represents the physical relics of Lord Buddha among the Uddeshika and Paribhogika aspects. In most instances, Ashta Mangala are connected to doorways, the intention being to wish the person passing through the doorway Sri prosperity and prosperity in wealth Sri Samurdhi and Dhana samurdhi. Therefore, it could be considered that the fronstpiece (Vahalkada) means a doorway. The use of words Ayaka, Adimukha, as well as Vahalkada, in written sources signifies a doorway. Furthermore, the model of a building on top, considered as the most important part of a frontspice, could be identified as a triple door platform. At several places, including Sigiriya, similar triple doors are to be seen. The fronstpiece is an important part constructed to convey the devotees, by means of symbols and in a circumlocutory way, towards the holy relics inside the inner chamber of the dagoba.

**Key words:** *Frontspiece (ayaka), dagoba, sculptures*

## වාහල්කඩ කැටයම් : ශ්‍රී ලාංකේය කැටයම් කලාවේ අක්මුල්

### 1.හැඳින්වීම

ලාංකේය කලා ශිල්ප පිලිබඳ අධ්‍යයනයන්හිදී වාහල්කඩ කැටයම් වලින් ලැබෙන පිටිවහල අතිශය වැදගත් ය. මේවා මුල්ම ලාංකේය කලා නිර්මාණ සේ සැලකීම ඊට හේතුවයි. මේවා දෙස සෞන්දර්යාත්මක දෘශ්‍යී කෝණයෙන් බැලීමට අතිරේකව එවකට ලංකාවේ පැවති ආගමික විශ්වාස පිලිබඳ අවබෝධයක් ලබා ගනු වස්ද සැලසෙනුයේ අපමණ මෙහෙවරකි.

කණ්ඨක චෛතියේ නැගෙනහිර වාහල්කඩත් මිරිසවැටියේ දකුණු වාහල්කඩත් මැනවින්ම සුරක්ෂිත වාහල්කඩ සේ සලකනු ලැබේ. මිහින්තලේ කණ්ඨක චෛතියේ වාහල්කඩවලට පරිබාහිරව අනුරාධපුර මිරිසවැටිය, දකුණු දාගැබ, ජේතවනය, අභයගිරිය මෙන්ම අග නගරයෙන් බැහැරව පිහිටි තිස්සමහාරාම යඨාල දාගැබ, අම්පාරට නුදුරු දීඝවාපිය යන තැන්හි වාහල්කඩ අවශේෂ දක්නට ලැබේ. වාහල්කඩ යන දාගැබ් අංගය සෑම පැරණි දාගැබකටම එක් කරනු වෙනුවට තෝරාගත් දාගැබ් කිහිපයකට පමණක් ආදේශ කරන ලද්දේ ඇයිද යනු නොපැහැදිලිය. මිහින්තලේ කණ්ඨක චෛතියේ වාහල්කඩ ක්‍රිස්තු වර්ෂ 1 හෝ 2 සියවස්වලට අයත් විය හැකි බව මහාචාර්ය සෙනරත් පරණවිතානයන්ගේ නිගමනයයි. මේ අනුව ලංකාවේ අනෙකුත් දාගැබ්වල වාහල්කඩ කැටයම් ඉන් පසු කාලවලට අයත් විය යුතුය.

දාගැබ් වාහල්කඩේ මූලික සැලැස්ම හා කැටයම් අන්තර්ගතය අඩු වැඩි වශයෙන් සියලු වාහල්කඩ නිර්මාණයන්හි සමානය. එබැවින් එක් වාහල්කඩක් සඳහා දෙනු ලබන අර්ථ නිරූපණයන් අනෙත් වාහල්කඩ සඳහා ද මුලුමනින්ම හෝ යම් පමණකට ආදේශ කළ හැකි ය. මීට අතිරේකව ලාංකේය කලාවේ අක්මුල්



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

සෙවීමට ද එහි විකාශය හඳුනා ගැනීමට ද කණ්ඨක චේතියේ වාහල්කඩවලින් ලැබෙන්නේ අනගි පිටිවහලකි.

මේ නිගමනය මත පිහිටා ලංකාවේ හොඳම වාහල්කඩ නිර්මාණය සේ සැලකෙන මිහින්තලේ කණ්ඨක චේතියේ වාහල්කඩ මෙම අධ්‍යයනය සඳහා යොදාගනු ලැබ ඇත. ඒ අනුව මෙහි ඉදිකිරීම් ස්වභාවය මෙන්ම වාහල්කඩකින් මතුවන සංකේතාර්තය පිළිබඳව පාඨකයාට යම් වැටහීමක් ලබා දීම මේ ලිපියේ අරමුණ වන්නේය.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙය ක්ෂේත්‍ර දත්ත රැස්කිරීමෙන් හා එම දත්ත පැරණි සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ආධාරයෙන් අර්ථනිරූපනය කොට සිදු කරනු ලබන අධ්‍යයනයකි. මිහින්තලේ කණ්ඨක චේතියේ වාහල්කඩට පසුකාලීන වූ වාහල්කඩ ද වාහල්කඩේ මූලාදර්ශ සේ සැලකෙන ඉන්දීය උදාහරණ ද යම් පමණකට මෙම අධ්‍යයණයෙහිදී අවධානයට යොමු කරනු ලැබ ඇත.

අනුරාධපුරයෙහි හා මිහින්තලයේ දාගැබ්හි ඇති කැටයම් ලාංකේය කැටයම් කලා නිර්මාණ අතර ඇති ඉපැරණිතම නිදසුනක් ලෙස සලකනු ලැබේ. මේ කරුණ මත වාහල්කඩ කැටයම්, ලංකාවේ කැටයම් කලා නිර්මාණයන්හි මූලාකෘතීන් පිළිබඳ අධ්‍යයනයන් උදෙසාත්, පශ්චාත් කාලීනව කැටයම්වල ඇතිවූ විකාශණයන් හඳාරනු සඳහාත් මහගු මූලාශ්‍රයන් බවට පත්වේ.

## 3. ප්‍රතිඵල සාකච්ඡාව

අනුරාධපුරයේ අභයගිරි, ජේතවන, රුවන්වැලි හා දක්ඛිණ ථූපයන්හිත්, මිහින්තලයේ කණ්ඨක චේතියේත් වාහල්කඩ කැටයම් මෙතෙක්ම දක්නට හැකිය. මිරිසවැටි දාගැබේ බටහිර වාහල්කඩත්, මිහින්තලේ කණ්ඨක චේතියේ වාහල්කඩ කිහිපයකුත් මේ අතුරින් වඩාත් මැනවින් නිරුපද්‍රිතව පවත්නේ ය. එහෙත් මෙම වාහල්කඩ නිර්මාණ සියල්ල එක්ව ගත් කල්හි ඒවායේ නිර්මාණය, සැලැස්ම හා කැටයම් ඇතුළු සැරසිලි අංගයනුත් එකිනෙකට එපමණට වෙනස් නොවේ. වාහල්කඩවල මිණුම් හා සැරසිලිවල ඇති අවශ්‍ය වෙනස්කම් කිහිපයක් හැරුණු කොට, අනුරාධපුරයෙහි හා මිහින්තලයේ ඇති වාහල්කඩ නිර්මාණ මෙසේ එකිනෙකට ඉමහත් ලෙස සාදෘශ්‍යරූපී වීමෙන් පෙනෙන්නේ (පරණවිතාන 1963 : 38), මේවා නිමවූ ශිල්පීන් අතර, වාහල්කඩ නම්වූ දාගැබ් අංගය නිමවීමේදී එක්තරා පොදු සම්මුතියක් පැවති වගයි. මේ හේතුව මත එක් වාහල්කඩක නිර්මාණය පිළිබඳ අදහස් හෝ කැටයම්වල සංකේතාර්ථය පිළිබඳව සළසනු ලබන අර්ථ නිරූපණයක් බොහෝදුරට අවශේෂ වාහල්කඩ නිර්මාණ කෙරෙහි ද අනන්‍ය සාධාරණ බවට පත්වෙයි. මිහින්තලේ කණ්ඨක චේතියේ කැටයම් වලට වඩා පරිණත අවස්ථාවකට (අයත් කැටයම් තුළින් අභයගිරි දාගැබේ වාහල්කඩ සැරසී ඇති බව උදාහරණ ලෙස ගතහොත්, වාහල්කඩ නිර්මාණයෙහි සැරසිලිවල එක්තරා විකාශණයක් හඳුනාගත හැකිවන මුත්, වාහල්කඩවල ගෘහ නිර්මාණමය විකාශණයක් හෝ සැරසිලි පිළිබඳ ප්‍රබල විකාශණයක් හෝ හඳුනාගත හැකිවී නොමැත. කෙසේ වුවද අනුරාධපුර වාහල්කඩවල ඇති කැටයම් සියල්ලෙහිම පාහේ ඉන්දියාවේ සාංචි, භාර්හුත් හා විශේෂයෙන්ම ආන්ද්‍ර (අමරාවතී) යන තැන්හි ඇති මුල්ම ඉන්දීය පෙතලි රූ කැටයම්වල ආභාෂය නොමඳ ය. ස්තූප වාහල්කඩේ මූලාදර්ශය පවා ඉන්දියාවේ ක්‍රිෂ්ණ නදී බඩ ඇති අමරාවතී ස්තූප අනුසාරයෙන් සපයා ගත්තක් බව පරණවිතාන (1963 : 48 - 49) නිගමනය කරයි. මෙම කලා හා ගෘහනිර්මාණ ආභාෂයන් තුළින් ද සාධක එළවෙන පරිදි වාහල්කඩ හා ඒවායෙහි වූ කැටයම් මුල්ම ලාංකේය කැටයම් කලා නිදසුන්සේ සැළකීමේ බාදාවක් නොපෙනේ.

වාහල්කඩ නම් වූ ස්තූප අංගය දාගැබට එක කරන ලද්දේ දාගැබ නිර්මාණය කරන ලද මුල්ම අවස්ථාවේ නොවන බව ස්මිදර් (1897 : 21), පරණවිතාන (1963 : 46 - 43) වැනි විද්වතුන් විසින් පෙන්වා දී තිබේ. එහෙත් මහාචාර්ය පරණවිතාන "වාහල්කඩවල් ලංකාවේ ස්තූප නිර්මාණය පිළිබඳව දෙවන සියවසේදී පමණ ඇති වූ නව විකාශනයක් ද එසේ නැතහොත්, මීට වඩා චාම් ලෙස දිරාපත්වන සුළු ද්‍රව්‍යයන්ගෙන් තනා තිබූ වාහල්කඩවලට සමාන වූ පැරණි නිර්මාණයක් වෙනුවට ඉදිකරවන ලද ඒවාද කියා සිතීමට කරුණු නොමැතිය." (1963 - 47) යි පවසමින් තමා මේ පිළිබඳව උපන් අවිනිශ්චිත බව ද සටහන් කරයි. වාහල්කඩක ඇති සුවිශේෂ නිමාව හා එහිවූ කැටයම්, චිත්‍ර ආදී සැරසිලි අංග කෙරෙහි දක්වන ලද විශේෂ අවධාරණයෙනුත් පෙනෙන්නේ, වාහල්කඩක් දාගැබක වැදගත් අංගයක් ලෙස සළකන ලද බවකි. මිහින්තලේ කණ්ඨක චේතිය වාහල්කඩ වැනි ලංකාවේ ඉපැරණිතම කැටයමින් සැරසුණු චෛත්‍ය අංගයක්, පිරික්සීමෙන් පෙනෙන්නේ එම අංගයෙහි කදිම නිමාවත්, එහි වූ කැටයම්වල මනා සංඝටනයන් සංවිධානයකින් හෝ පළපුරුද්දකින් තොරව ලැබිය නොහැකි වගයි. පරවිතාන (1963 : 48) සිතන පරිදිම ලංකාවේ, වාහල්කඩවලට මූලාදර්ශයන් ඉන්දියාවේ ආන්ද්‍ර ස්තූපයන්හි ආයක නම් අංගය කෙරෙන් සැළසෙන්නට ඇති නමුදු, ලංකාවේ වාහල්කඩ, ආන්ද්‍ර ස්තූපයන්හි " ආයක" නම් අංගයෙහි නිර්මාණ සමග ඇත්තේ සුළු සමානකමක් බව පරණවිතානම පිළිගනී. ආයක යන ආන්ද්‍ර ස්තූපයනට යාබඳ ගෘහාංගය ස්තූපයෙන් පිටතට නෙරා එන වේදිකාවක් මතින් නැගෙන කුළුණු පහකින් යුත් නිමවුමක් විය (Barrett 1954 : PL.II-III). අප හමුවේ පවත්නා මෙවැනි විශිෂ්ට සංවිධානමය සැළැස්මකින් හෙබි වාහල්කඩවලට සාකල්‍යයෙන්-ම සමවන ගෘහාංගයක් ඉන්දියාවේ හෝ ලංකාවේ දක්නට නොලැබීමෙන් පෙනෙන්නේ වාහල්කඩට ඇතුලත් සැරසිලි හා වාහල්කඩක සැළැස්ම පිළිබඳ ගෞරවයන් ලාංකිකයා විසින් දිනාගනු ලබන බවයි. මෙම වාහල්කඩ නිමවූවන්, හුණුගලින් හා ගඩොලින් මෙවැනි විශිෂ්ට නිර්මාණයක් කිරීමේ දැනුම එකවරම අත් කොට ගන්නා ලදැයි සිතිය නොහැකි-ය. එබැවින් අප හමුවේ අද දක්නට ඇති වාහල්කඩ නිර්මාණයන්, ඊට කලින් සිට පැවති මීට සමවන දාගැබ අගයක දියුණු අවස්ථාවකට අයත් එකක් බැව් සිතීම අනුචිත නොවිය හැක ය. එහෙත් මෙම වාහල්කඩවලට මෙවැනි අසංවර්ධිත මූලාකෘති වීනම් ඒවා අද එහි දක්නට නොහැකි ය. මීට සැළසිය හැකි එකම විසඳුම නම් මම වාහල්කඩවලට මූලාදර්ශයන් වූ දැවමුවා මෙවන් නිර්මාණයක් මෙම වාහලකඩ පිහිටි ස්ථානයෙහි මුල සිටම පවතින්නට ඇති බවයි. මෙම


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

දැවමුවා මූලාකෘතීන්හි පැතලි ලෙස නෙළා තිබෙන්නට ඇති කැටයම්, වාහල්කඩ ගලින් හා ගඩොලින් නිමවන්නට වූ පසු ඊට ආරෝපණය කරන්නට ඇත.

චෛත්‍යයක ගඩොළුමය ගර්භයත්, සෙල්මුවා යූපස්ථම්භයත් හැරුණු කොට ඡත්‍ර හා සිවුරැස් කොටුවත් (හර්මිකා), පේසාවලලුවල මූලාදර්ශ සේ සැලකෙන කුච්ඡවේදී හා මුද්ධවේදී නම් වූ ප්‍රදක්ෂිණා පථයනට සබඳව පිහිටි ගරාදි වැටවලුත් මුල්කාලීන ස්තූපයන්හි දැවයෙන් නිර්මාණය කොට තිබීමෙන් පෙනෙන්නේ දාගැබකට සබැඳිවූ දැවයෙන් නිර්මාණය කිරීමේ හැකියාව ඇති සැම උප අංගයම දැවයෙන් නිර්මාණය කරන ලද බවයි. අර්ධවෘත්තාකාර හැඩය හා සුවිසල් බවත්, යූපස්ථම්භය සෙල්මුවා නිර්මාණයක් විය යුතු බවට වූ එවකට ඇතැම් විට  තිබෙන්නට ඇති සාම්ප්‍රදායික අදහසුත් නිසා, දාගැබක යථෝක්ත අංග දැවයෙන් නිමවීමට හැකිවුයේ නැත. එහෙත් වාහල්කඩ වැනි කුඩා පරිමාණයේ ගෘහාංගයක් ඉතා පහසුවෙන් දැවයෙන් නිර්මාණය කිරිමේ හැකියාවක් සැළසෙන අතර, ඡත්‍ර, හර්මිකා හා වේදී යනාදී විශේෂ අංගයනුත් දැවයෙන් නිමවූ බැව් සළකන කළ වාහල්කඩ දැවයෙන් නිමවන්නට ඇතැයි සිතීම අපහසු නොවේ.

වර්තමානයේ අප හමුවේ පවත්නා ශෛලමය වාහල්කඩ නිර්මාණයෝ බෙන්ජමින් රෝලන්ඩ්ගේ (1959 : 200) අදහසට අනුව ක්‍රිස්තුවර්ෂ 3-4 සියවස් අතරටත්, පරණවිතානට අනුව (1963 : 46) ක්‍රිස්තු වර්ෂ 2 සියවසටත් අයත් වෙයි. අභයගිරි දාගැබේ වාහල්කඩකින් ලැබුණු ලේඛණයකට අනුව කණිට්ඨ තිස්ස (ක්‍රි: ව: 226 - 244) රජු විසින් එහි "චතර අයක" කරවන ලද වග කියා තිබේ. (EZ. 1,255) රුවන්වැලි දාගැබ වාහල්කඩකින් ලැබුණු ලේඛණයක් අනුසාරයෙන් මෙම වාහල්කඩ ක්‍රි: ව: 1 - 2 සියවස් වලට අයත් වෙතැයි පවසමින් පරණවිතාන (1963 : 53) තමා ඉහත පවසන ලද ක්‍රි: ව: 2 සියවස කාලයෙන් මඳක් ඔබ්බට ගොස් වාහල්කඩවල කාලය සෙවීමට යත්න දරා තිබේ.

වාහල්කඩ නම් දාගැබ උප අංගය දාගැබකට එක්කරනා ලද්දේ කවර අභිමතයකින් ද යන්න පිළිබඳ ව විද්වත්හු නානා විධ අදහස් පළ කරති. ''වාහල්කඩවලින් ඉටු වූ කාර්යය තවමත් සතුටුදායක ලෙසින් පහදාදී නොමැත. ඒවා පේස වළලු වලට නැගීමට තනා තිබූ පියගැට පෙළවල් සඳහා කරන ලද ආවරණ යයි යෝජනා කර තිබේ. එහෙත් ස්මිදර් මහතා විසින් පෙන්වා දී ඇති අයුරු රුවන්වැලි සෑයේ සහ අනෙක් චෛත්‍යවල මෙන් මිරිසවැටි දාගැබේ පියගැට පෙළවල් තනා තිබුණේ වාහල්කඩවල පිටුපසින් නොවේ. කණ්ඨක චෛත්‍යයෙහි ඉහළ පේසාවන්ට නැගීම සඳහා ගඩොලින් බැදි පියගැට පේළි තනා තිබුණි. ඒ දකුණු වාහල්කඩෙහි නැගෙනහිර පැත්තෙනි. ඒ නිසා මේ සමයෙහි කැටයම් කළ මල්කම් සැරසිළි කොටසක් වැසී තිබේ. පියගැට පේළි තනා ඇත්තේ වාහල්කඩ තැනීමෙන් පසුව බව මින් පැහැදිලි වේ. එබැවින් වාහල්කඩ තනවන ලද්දේ එය නිම වූ කාලයේදී නොතිබුණු චෛත්‍යාංගයක, ආවරණයක් පිණිස නොවිය යුතුය. පාකර් මහතාගේ අදහස පරිදි වාහල්කඩ වූකලී ඊට ඉදිරියෙන් සෑමළුව මත පිහිටුවන ලද ශෛලමය පුෂ්පාසන (මලසුන්) සඳහා කළ ආරක්ෂක පසුතල විය. ස්මිදර් මහතා විසින් මෙම චෛත්‍යාංගය හැඳින්වීම පිණිස යොදා ඇති  ප්‍රොන්ටිස්පීස් (Frontispiece) යන වචනය අනුචිත යැයි පාකර් මහතාගේ මතය විය. එහෙත් මෙහි සඳහන් වූ මලසුන් නියම වශයෙන් ම වාහල්කඩවලට වඩා පසු කාලයේදී නිමවන ලද බව යට දැක්විණ. ඒවා පැරණි මලසුන් වෙනුවට අභිනවයෙන් තැන ඒවා යයි අදහස් කළද මලසුනේ උපාංගයක් ලෙස සලකා එහි පසුතලයක් වශයෙන් ඉදිකරන ලද නිර්මාණාංගයක් වූ වාහල්කඩ මලසුනට වඩා විසිතුරු ලෙස අලංකාර කරන්නට ඇතැයි සිතිය නොහැකි ය. ඇතැම් ලේඛකයන් විසින් වාහල්කඩවල් ගර්භ ගෘහ (Chapal) හෙවත් පූජාසන (Altar) නමින් හඳුන්වනු ලැබේ (පරණවිතාන 1963 :47)". මහාචාර්ය පරණවිතානගේ අදහස වුයේ ලංකා ස්තූපයේ වාහල්කඩ පිළිබඳ අදහස ඉන්දියාවේ අමරාවතී පෙදෙසේ ක්‍රිෂ්ණ නදීබඩ ස්තූපයන් හී වූ "ආයක" නම් අංගය තුළින් සළසා ගත් වගයි. "ආයක"  යන්න "දෙරටුව" ලෙස බර්ජස් විසින් අරුත් බිඳ ඇති අතර, අමරාවතී ස්තූපයන්හි "ආයක" යන්ගෙන් ප්‍රභවය විනැයි සැළකෙන ලක්දිව ස්තූපයන්හි " වාහල්කඩ" යන වදනෙහි අරුත දොරටුව යනුයි. අමරාවතී ස්තූපයන්හි වූ "ආයක" යන්නම පූර්ව ''ආ" කාරය භ්‍රෂ්ව කොට ලක්දිව ස්තූප වාහල්කඩ විෂයෙහි "ආයක" ලෙස වහරනු ලැබූ බව අභයගිරි වාහල්කඩකින් ලැබුණු කණිට්ඨතිස්ස රාජ්‍ය කාලයට අයත් ශිලා ලේඛණයෙන් පැහැදිලි වෙයි.

වංශකතාවේ මේ අංගය හැඳින්විමෙහිලා යෙදෙන "ආදීමුඛ" යන්නෙහි අරුතද "අයක" යන්නට හෝ දොරටුව යන අරුතට හෝ වෙනස් නොවේ. වාහල්කඩ හා ''අයක" යන්නෙහි දොරටුව යන අරුතත් ඇතැයි පරණවිතාන පිළිගෙන තිබෙන මුත්, වාහල්කඩ දාගැබකට එක් කරන ලද්දේ දාගැබක් පර්වතයක අනුරුවක් බවට පැමිණවීමේ අරුතකින් බව අවධාරණය කර තිබේ. (පරණවිතාන 1963 : 54) මහා+වංශයේ වාහල්කඩ හැඳින්වීම සඳහා එක්තැනක යෙදි ඇති " ආදිමුඛ" යන්න ලේඛකයා අතින් සිදු වූ දෝෂයක් විය හැකි වග පවසන පරණවිතාන, එය "අද්දිමුඛ'' කියා නිවැරදි වුවහොත් ඉන් පර්වත මුහුණත යන අරුත නිපදෙන බව පවසයි. ඔහු පවසන පරිදි ස්තූපය සතර පස ඇති වාහල්කඩවල පැති තවදුරටත් අඛණ්ඩව දෙපසට ගලා යන්නට සැලැස්වුව හොත් දාගැබක ආකෘතිය සිවුරැස් වනු ඇත. වාහල්කඩ සතර සතරපස යොදන ලද්දේ දාගැබේ වූ පැති හතර හා එහි සිවුරැස් බවත් මූර්තිමත් කිරීම පිණිස බව පරණවිතානගේ අරුත් දැක්වීමේ සාරයයි.

වාහල්කඩ යන වදනෙහිත්, මෙම නිර්මාණය හඳුන්වනු සඳහා ඉන්දු හා ලාංකේය මූලාශ්‍රයන්හි යෙදෙන "ආයක", "අයක", "ආදීමුඛ" ("ආදි" යනු "ඉදිරියෙන් වූ '' යන අරුතත්, "මුඛ" යනු විවරය හෝ දොරටුව යන අරුතත් ගෙනදේ. මෙය එක්ව ගත් කල්හි "ඉදිරි දොරටුව" යන්නට සම අරුතත් නිශ්පන්න කෙරෙයි) යන වදන්වල දොරටුව යන තේරුම ඇතැයි සළකන කළ, වාහල්කඩ නම් වූ මෙම නිර්මාණය දොරටුවක් හා සමීප ඇසුරක් පැවැත්වූ වග පිළිගත හැකි කරුණකි. සැබවින් ම වාහල්කඩක් යනු දොරටුවක් සංකේතවත් කෙරෙන ඉදිකිරීමක් වූවගට සාධක, වාහල්කඩ නිර්මාණ සැළැස්ම තුළින් මෙන් ම, එහි සැරසිළි අංග ළින්ද උකහා ගත හැකි ය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

අපි මේ පිළිබඳ විවරණයකට පළමු වාහල්කඩක සාමාන්‍ය සැළැස්ම දෙස අවධාණය යොමු කිරීම සුදුසු ය. දාගැබෙන් ඉදිරියට නෙරා එන ප්‍රක්ෂේපණයක් වන වාහල්කඩෙහි වඩා ඉදිරියට නෙරා එන මධ්‍ය ප්‍රක්ෂේපණයක් ද, ඊට පරිවාර වශයෙන් දෙපස පිහිටි පසුපසට පැන්නුනු ප්‍රක්ෂේපණ ද්වයක් ද වේ. දෙපස ප්‍රක්ෂේපණ ද්වය සීමාවනුයේ වාහල්කඩ දෙපස සිටුවා තබන ලද කැටයමින් සරහන ලද ස්ථම්භ දෙකකට ය. මෙම එක් එක් උස් කැටයම් කුළුණක් පාමුල තවත් නොඋස් කැටයම් පුවරුවක් බැගින් දක්නා ලැබේ. වාහල්කඩක යටින්ම පිහිටියේ එහි පාදම් කොටස ලෙස සැලකිය හැකි කැටයමින් එපමණට ආඪ්‍ය නොවන හුණුගල්මුවා කොටසකි. එය මත වූ හුණුගල්මුවා කොටස තිරස් අතට දිවෙන පටි මගින් පනේල අටකට බෙදා තිබෙයි. මෙහි පහතම පනේලයෙහි උක්කුටුකයෙන් හිඳින ඇත් රූ පෙලක් නෙළා තිබෙන අතර, ඊට ඉහළින් පිහිටි පනේල තුන බිතු සිතුවමින් සරහා තිබිණ. පස්වන පනේලයෙහි වූයේ මකර මූවකින් නික්ම ගොස් උඩට විවෘත වන බිතු කුළුණුවලින් සැදුම් ලබන ''මකර ශීර්ෂ ධර' නමින් හැඳින්වෙන රූකම් පෙළකි. ඊට ඉහතින් පිහිටි පනේල තුන නැවතත් සිතුවමින් සරහනු ලැබ තිබිණි. කණ්ඨක චේතියේ වාහල්කඩ වල මෙම පනේල වෙන් කරන පටි පියුම්පෙති, ගිනිදැල්ල හෝ පලාපෙති, චෛත්‍ය කාවාට, හංස, වාමන හා ගරාදිවැට අපෝන්නත රූකම් තුලින් සරහා තිබිණි. මිරිසවැටි වාහල්කඩවල වාමන පෙළ නොදක්නා ලැබෙනමුත්, එහි ඒ වෙනුවට ඇත්, අස්, සිහ, ගව යන සිවුපාවනුත් මිනිසුනුත් එක පෙළට දිවයන අයුරේ කැටයම් තීරයක් යොදා තිබේ. හුණුගලින් නිමවා ඇති ඉහත කී කොටස්වලින් සැදි වාහල්කඩෙහි උපරිභාගය සැකසුනේ ගඩොලින් නිමවන ලද එකිනෙකට බැඳි විමාන තුනක අනුරුවකිනි. වෙනත් ලෙසකින් කිවහොත් හුණුගල්මුවා පහළ කොටස නිමවන ලද්දේ උඩින් ම පිහිටි මේ විමානයට පදනමක් වශයෙනි. මෙනයින් වාහල්කඩේ වඩා වැදගත් කොටස වනුයේ ඉහළම පිහිටි මෙම විමාන ආකෘති විය යුතුය. ''කණ්ඨක චෛත්‍යයේ (වාහල්කඩෙහි) උපරිභාගය තනි ගඩොලින් සෑදු විමාන තුනකින් යුක්ත විය. වාහල්කඩෙහි ගල් අල්ලා තනන ලද කොටස මේ විමාන තුන සඳහා අධිතාලමක් වශයෙන් යෙදුණු බව පෙනේ. එහි ඉදිරියට නෙරූ කොටස මත පිහිටි මධ්‍ය විමානය සැළැස්ම අතින් ආයතය. දෙපස පිහිටි විමාන දෙක චතුරශ්‍රාකාර සැළැස්මෙන් යුක්ත වන අතර ඒවායේ පාද බොරදම්වලින් සහ කපෝත බොරදම්වලින් යුක්ත වූ සණ බිත්තිවල මාර්ගයෙන් මධ්‍ය විමානයට සම්බන්ධ වේ. විමානයේ පාදම් ද බොරදම් සහිත විය. එක් එක් විමානයක තුන් පැත්තක බිත්ති කුළුණු (කුඪ්‍ය ස්ථම්භ) මගින් සැදි පඤ්ජරය (එක් පැත්තක තුන බැගින්) බැගින් දක්නා ලැබේ. ප්‍රධාන විමානයේ ඉදිරි පාර්ශ්වය මැද පිහිටි පඤ්ජරය ගැඹුරු ය. සෙසු පඤ්ජර ගැඹුරු නොවේ. ඒ එක් එක් පඤ්ජරයක දෙවියෙකුගේ හෝ දේවතාවියකගේ හෝ හිදි පිළිමයක් පිහිටුවා තිබුණි..... (පරණවිතාන 1963 : 41)."

වාහල්කඩ මත පිහිටි මෙම විමාන දිව්‍ය වාසභවනයන්හි මනොමය ප්‍රතිමූර්ති විය හැකි බැව් සළකන ලද නමුත්, මේවා දිව්‍යමය වාසභවනයන් බැව් දැක්වීමට ඇති සාධක ප්‍රමාණවත් නොවේ. සැබැවින්ම මෙහි ඇත්තේ එක් එක් විමානයකට එක් දොරටුවක් බැගින් වූ දොරටු තුනක් පමණකි. මේවා නිමවූවන්ට දිව්‍යමය වාසභවනයක් දැක්වීමට අවශ්‍ය විනි නම්, මේවායෙහි දොරටු වලට අමතරව එවැනි භවනයක් බැව් දැක්වීමට ඇවැසි කවුළු සඳළුතල ආදී අංගයන් මීට එක්කරනු නිසැක ය. ලං ලංව පිහිටි මෙම විමාන තුනෙහි මධ්‍යය විමානය, දෙපස වූ විමාන ද්වය හා සබඳවූයේ බොරදමින් සැරසුණු සණ බිත්ති දෙකක මාර්ගයෙන් බව පරණවිතාණයේ ඉහත දැක්වූ විස්තරයෙන් පෙනේ.

මෙසේ විමානත්‍රය බිත්තිවල මාර්ගයෙන් සබඳව තිබීමෙන් පෙනෙන්නේ මේ ගොඩනැගිල්ල බිත්තියකට සබඳව ඉදිවූවක් බව ය. ද්වාර මණ්ඩපයක් නිතරම පිහිටියේ සීමා බිත්තියකින් පිරිකෙව් වූ බිමකට ඇතුළුවනු සඳහා ය. ඉහත කී විමාන ආකෘති තුන සබඳ කෙරෙනුයේ බිත්තියක මාර්ගයෙන් වීමෙන් පෙනෙන්නේ මින් අදහස් කරන ලද්දේ ද්වාර මණ්ඩපයක් බවයි. මධ්‍ය ප්‍රක්ෂේපණයක් හා එය දෙපස පිහිටි ප්‍රක්ෂේපණ ද්වයක් ද සහිතවන දොරටු තුනකින් යුත් ද්වාර මණ්ඩප තුනක් සීගිරි විනෝද උයනේ, ජල උද්‍යාන නම් වූ උපකොටසට ඇතුළුවනු සඳහා, ජල උද්‍යානය පිරිකෙව් කොට වූ බිත්ති මධ්‍යයෙන් ඉදිව පවත්නේය. මේ අතරින්ද වඩාත් විශිෂ්ට වනුයේ එහි බටහිර සීමාපවුර හරහා වූ ප්‍රධාන ද්වාර මණ්ඩපයයි. මෙය කෙතරම් වාහල්කඩ උපරි භාගයේ වූ විමානයන් සමග සාදෘශ්‍යරූපි වන්නේ ද යත් පරණවිතාන විසින් වාහල්කඩ විමානය පිළිබඳව ඉහත කළ විස්තරය සීගිරියේ මෙම ද්වාර මණ්ඩපය කෙරෙහි ද බොහෝ දුරට අනුකූලය. (දිසානායක 19865 : 17) මෙම ත්‍රිත්ව ද්වාර මණ්ඩප සංකල්පය සියමේ වින්ග්රායි චෛත්‍යය, කම්පුචියාවේ අංකෝර්හි කොහ්කෙර් විහාරය, වියට්නාමයේ යෙන්සෝ විහාරය, ෆෝර්බ්ඩෙන්හි රාජකීය මාළිගය වැනි අග්නිදිග ආසියාතික පුරාස්ථාන ආශ්‍රිතව ද දැකි ය හැකිවේ.

අනුරාධපුර යුගයට අයත් කැසිකිලිගල් හා කොරවක් ගල්වල ද පැරණි ද්වාරමණ්ඩපයන්හි ආකෘතීන් යැයි සිතිය හැකි අනුරූ නෙළා තිබෙයි. මින් පෙනෙන්නේ වාහල්කඩක උපරිභාගයෙහි වූ ගොඩනැගිලි හැඩය මනෝමය නිර්මාණයක් නොව, ලංකාවේ ප්‍රායෝගික ගෘහ නිර්මාණයෙහිදී ද්වාර මණඩපයක් ලෙස ප්‍රයෝජනයට ගත්තක් බවකි.

වාහල්කඩක් යනු දොරටුවක් නිරූපණය කරවන්නක් නම්, වාහල්කඩක යෙදෙන කැටයම් ආදී සැරසිලි ද ඊට අනුකූල වීම අවශ්‍ය සිද්ධියකි. වාහල්කඩක කැටයමින් වඩාත් අඪ්‍ය කොටස වූකලී, වාහල්කඩ දෙපස සිටුවා ඇති හුණුගල්මුවා කුළුණුයි. වර්ග කිහිපයකට අයත් කැටයම් කුළුණු මේ දාගැබ ඇසුරින් හමුවේ. අනුරාධපුර හා මිහින්තල දාගැබ් ඇසුරින් සුලභ ලෙසම හමුවන කැටයම් ස්ථම්භයන්හි යෙදෙනුයේ පුන්කළසක සිට අතුපතර වීහිදෙමින් ඉහළට නැගෙන රටාගත ශාඛයකි. මෙම රටාගත ශාඛයේ පහළම වූ දෙපසට විහිදෙන අතු ද්වයෙහි එකිනෙකට පිටුපා සිටගත් හස්ති යුගලය ද, ඊට ඉහළින් අතු ද්වයෙහි මිනිස් යුගලයක් ද මීළඟට අස්, මිනිස්, සිංහ, මිනිස්, ගව, මිනිස් යන පිළිවෙලට නැවතත් ඔවු නොවුන් යුගල වශයෙන් අතු පතරෙහි ලැගුම්ගෙන හිදිත්. ශාකයේ දළුව කෙළවර වනුයේ පිපි පියුමකි. මහාචාර්ය ඔස්මන් බෝපෙආරච්චි මහතාගේ අදහස


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

වනුයේ මෙහි මිනිස් රූප ලෙස පෙනෙන කැටයම් කියුපිඩ් නම් දෙවියාගේ බවත් මින් රෝම ආභාෂය මතුවන බවත් පවසයි (ඔස්මන් බෝපෙආරච්චි 2020 ඃ 72-73) මෙම පියුම මත ආසනාරූඪවූ මහේ+ශාඛ්‍ය පුද්ගලයෙකුගේ රුවකි.

මෙම රටාගත වෘක්ෂය කල්ප වෘක්ෂයක් බැව්ද, එම වෘක්ෂයේ දළු අග ආසනාරූඩවූ පුද්ගලයා කාම දෙවි වූ වරුණ බවද මහාචාර්ය පරණවිතානගේ (1954 ඃ 197 - 231) අදහස වන අතර, එම වෘක්ෂය අග හිඳිනා පුද්ගලයා සක්විති රජ රුවක් ලෙස හඳුනා ගැන්මට මහාචාර්ය ප්‍රේමතිලක (1080 ඃ 326 fig-t), උත්සාහ දරයි. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි කල්ප වෘක්ෂයක නිරූපණයක් ලෙස හඳුනා ගන්නා ඉන්දියාවේ සාංචි ස්තූපයෙහි වූ කැටයමක් හා වාහල්කඩ කැටයම්වල මෙම රටාගත ශාඛයේ වූ සාදෘශ්‍ය රූපීතාවය පරණවිතාන සිය මතයට ආධාරකයක් කොටගෙන තිබේ. බැලූ බැල්මට මෙම කැටයම් ද්වය අතර සමානකමක් පෙනෙතුදු එපමණටම අසමානතා ද මේ ද්වය සසඳන කළ අපගේ ඇස ගැටේ. සාංචි කැටයමේ ශාඛය නික්මෙනුයේ පුන්කලසකින් නොවේ. තවද මෙම ශාඛයේ අතුමත හිඳිනා සත්වරූ අතර සිංහයා හා තවත් හඳුනාගත නොහැකි සතෙකු ද පමණක් දක්නට හැකි වන අතර, මෙම සතුන් පිට මිනිසුන් ආසනාරූඪව හිඳියි. ශාඛයේ දළුවෙන් පැන නගින් පුන් පියුමක් හෝ එහි ආසනාරූඪ පුද්ගල රුවක් හෝ සාංචි කැටයමේ නැත (Bachhofer 1973 : Pl. 57).

අනෙක් අතට කල්පවෘක්ෂය සමග ඇත්, අස්, සිහ, ගව යන සිවුපාවුන්ගේ වූ සබඳතාවයන් පිළිබඳ කිසිදු සාධකයක් නැති අතර, කල්පවෘක්ෂය පුන් කලසකින් පැන නගින්නක් බවටද හේතු සාධක නොමැතියි. තවත් අතෙකින් කල්පවෘක්ෂය සමග කාම දෙවි වූ වරුණ සබඳ කෙරුණු විශේෂ අවස්ථාවක් පිළිබඳව ද අප නොදනිමු. මහාවංශයෙහි එන මහා ථූපයේ ධාතුගර්භය පිළිබඳ විස්තර වර්ණනාවෙහිත්, ධාතුවංශයේ එන සේරුවාවිල දාගැබේ ධාතු ගර්භය පිළිබඳ විස්තර වර්ණනාවෙහිත්, ඒ ඒ ධාතු ගර්භයන්හි කල්ප වෘක්ෂයන්හි අනුරූ තැන්පත් කරවන ලද බැව් කියා තිබේ. මහා ථූප ධාතුගර්භ මධ්‍යයෙහි හිඳ වූ බෝධිරුකේ කඳෙහි අෂ්ටමංගලිකා, පුෂ්පලතා, සිව්පා පන්තිය, හොබනා හංස පන්තිය ආදීය කරවන ලද බව කියා තිබේ (මහාවංශය, 35 පරි., 65-55 ගාථා). මෙහි සිවුපා පන්තිය යනු ලංකා කලාවේ අගතැන්හි වැජඹී ඇත්, අස්, සිහ, ගව යන සතුන් බව නිසැක ය. සේරුවාවිල දාගැබේ අෂ්ඨමංගල සමගින් තැන්පත් කරවන ලද සිවුපාවුන් ඇත්, අස්, සිහ, ගව යනාදී වශයෙන් නම් වශයෙන් ම සඳහන් කර තිබේ (ධාතුවංශය, 43). මේ ධාතු ගර්භ ද්වයෙහිම කල්ප වෘක්ෂ කැටයම් ද වූ වගත් එහෙත් ඇත්, අස්, සිංහ, ගව යන සත්ව රූ සබඳව පැවතියේ කල්පවෘක්ෂ සමග නොව අෂ්ටමංගල සමග බවත් මින් පැහැදිලි ය.

අෂ්ඨමංගල ලක්ෂණ යනු වාසනාව හා සෞභාග්‍ය සංකේතානුසාරයෙන් ගෙන හැර පෑමකි. ශ්‍රී දේවියගේ සංකේතය වූ ශ්‍රී වත්සය ප්‍රධාන කොට ඇති පූර්ණඝටය, චාමරය, දීපය, ඡත්‍රය, සංඛය, ස්වස්ථිකය හා අංකුසය අෂ්ඨමංගලවලට ඇතුළත් සංකේතයි. ඇත්, අස්, සිහ, ගව යන සතුන් හා හංසයනුත් අෂ්ට මංගල ලක්ෂණ තුළට ඇතුලත් නොවුවද ඒවාද අෂ්ටමංගල ලක්ෂණ හා සබැඳි ය.

මෙම කාරණය අනුරාධපුරයෙන් ලැබී කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කර ඇති අෂ්ට මංගල ලක්ෂණ දරණ කැටයම් ඵලකයෙන් (Karunarathna 1971:53) හා ජේතවන කැණීම්වලින් ලැබුණු අෂ්ට මංගල ලක්ෂණ නෙළූ පාත්‍රයෙන් ද සනාථ කෙරේ. අනුරාධපුරයෙන් ලැබී කොළඹ කටුගෙයි ඇති අෂ්ට මංගල කැටයම් ඵලකයේ අෂ්ටමංගල ලක්ෂණ සමගින් ඇත්, අස්, සිහ, ගව යන සතුනුත්, හංසයන්, පියුම් හා ලියවැලත් යෙදී තිබේ. ඔග්ගමුවෙන් ලැබී ඇති සඳකඩ පහණ ද මේ පිළිබඳ ප්‍රමාණවත් උදාහරණයකි. එහි පිටතම තිරයේ දෙපළකට සැදී මධ්‍යයේ වූ ශ්‍රී වත්ස සංකේතය දෙසට ගමන් කරන හස්තීන් නිරූපණය වන අතර ඊට ඇතුලත තිරයේ පුන්කලසකින් දෙපසට නික්මෙන ලියවැලක් ද, ඇතුලතම කොටසේ අඩ පියුමක් ද දැකිය හැකිය. මෙම සඳකඩ පහනේ හස්ති රූ පමණක් දක්නට ලැබෙතුදු ලංකාවේ අවශේෂ සඳකඩ පහන් බොහොමයක මේ තීරයෙහි සතුන් සිවුදෙන යෙදී ඇති බව සළකන විට මේ තත්වය අනෙක් සඳකඩ පහන් කෙරෙහි ද සාධාරණ විය හැකි ය.

වාහල්කඩ කැටයම් කුළුණේ යෙදෙන සැරසිලි ද මෙම අෂ්ඨමංගල ලක්ෂණ සමග යෙදෙන ඇතැම් සංකේත හා අනුරූපී ය. කොටින්ම කිවහොත් වාහල්කඩ කැටයම් කුළුණේ සැරසිලි තුළින් සෞභාග්‍යය හා ශ්‍රී සමෘද්ධිය මූර්තිමත් කෙරෙයි. එම කැටයම් කුළුණේ පහතින්ම වූ පූර්ණඝටය ජලයයි. සශ්‍රීකත්වයේ හා සෞභාග්‍යයේ උත්පත්තිය වූ ජලය බොහෝ විට ලාංකේය කලාවේ පූර්ණ ඝටයකින් සංකේතවත් කෙරෙයි. පූර්ණඝටයෙන් හෙවත් ජලයෙන් නැගෙන ශාඛය ජලයේ ඊළඟ ඵලය වූ ශෂ්‍ය සමෘද්ධියයි. එනම් උද්භිද විශේෂයි. උද්භිද විශේෂය තුළින් යැපෙන්නා වූ සත්ත්ව හා මනුෂ්‍ය සන්තතිය එහි ඊළඟ පියවරයි. ශාඛයේ අතුපතරෙහි ලැගුම් ගෙන සිටින්නෝ එම ශාකයන්හි ඵල ලබන්නා වූ එම සත්වයෝයි. සත්වයන්ට වඩා වැඩි වාර ගණනක් මිනිස් යුගල එහි යෙදී තිබෙනුයේ මනුෂ්‍යයා ශෂ්‍යයන්හි වැඩිම ඵල ලබන්නා වූ හෙයින් විය යුතුය. තවද සශ්‍රීකත්වය වඩාත්ම අපේක්ෂා කරන්නාවූ සත්වයාද බුද්ධිමත්කමින් අග තැන්පත් මනුෂ්‍යයාම වේ. මේ සියල්ලෙහි ඊළඟ ප්‍රතිඵලය විය යුත්තේ ධන සමෘද්ධි යයි. එනම් ශාඛමය දළුවෙන් පැන නගින පියුමෙහි ආසනාරූඪ පුද්ගලයා ධන සමෘද්ධිය සංකේතවත් කරන්නක් විය යුතුය. මේ මිනිසා වරුණ දෙවියා (Paranavitana 1951:197 - 231) හෝ සක්විති රජු හෝ (Prematilaka 1980 ඃ 326. Fig.6) නොව ධනයට අධිගෘහිත දෙවියා වන කුවේරගේ රුවක් ලෙස හඳුනා ගැන්මට තුඩු දෙන සංකේත එම රුව ආශ්‍රිත ව වේ. කණ්ඨක චෛතියේ බටහිර වාහල්කඩේ කැටයම් ස්ථම්භයන්හිත් වඩාත් පැහැදිලි ලෙස අනුරාධපුරයේ දක්ඛිණ ථූපයේ වාහල්කඩ කැටයම් ස්ථම්භයෙහිත් මේ ආසනාරූඪ දෙවියා දැක්ක හැකි ය. මෙම පුද්ගලයාගේ වම් උරහිසට ඉහලින් පද්මයක් (මෙය මහාචාර්ය ප්‍රේමතිලක චක්‍රයක් ලෙස හඳුනා ගැන්මට උත්සාහ දරයි. බලන්න Prematilaka 1980 ඃ 326) දකුණු උරහිසට ඉහළින් ශංඛය හා ඊට පහළින් පිළිවෙලින් විසිරුණු ආකාරයෙන් දැක්වුණු වෘත්තාකාර හැඩතල රැසකුත් දන්නා ලැබේ.



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ශංඛය හා පද්මය කුවේරගේ ප්‍රධානතම ධන නිධි ද්‍රව්‍ය හැඳින්වෙන සංක්තයයි. ශංඛයට පහළින් විසිරුණු වෘත්තාකාර හැඩතල කුවේර සංකේතයක් වන කාසි වේ (දිසානායක 1987 : 22). ඒ අනුව මෙම ස්ථානයෙහි දැක්වෙන්නේ සංඛ සහ පද්ම යන බහිරව යුග්මය පිරිවරා සිටින කුවේරවේ.

මිහින්තලේ කණ්ඨක චෛතියේ දකුණු වාහල්කඩෙන් හමුවන තවත් වාහල්කඩ කැටයම් කුළුණ වර්ගයකින් නිරූපණය වනුයේ පුන්කලසකින් නැගෙන රටාගත ලතාවක් හා එම ලතාවේ වක්‍රාකාර හැඩතල තුළ යොදා ඇති ඇත්, සිංහ, අස්, මිනිස් හා පක්ෂිරූපත් ය. මෙහි දළුවෙහි පෙන කිහිපයකින් යුත් නාගයෙකුගේ රුවකි. මෙම වාහල්කඩේම අනෙක් පස කුළුණෙහි ඇත්, ගව, සිංහ, හා පක්ෂි රූ දරණ කළසකින් පැන නගින ලියවැලකුත්, ලියවැල මත ස්ත්‍රියක් හා පුරුෂයෙකුගෙන් සැදි මිථුන රුවකුත් වේ.

අෂ්ටමංගල හෙවත් සෞභාග්‍යයට සබඳ සංකේත දොරටුවක අරුතක් ගෙන දුන් වාහල්කඩකට යොදන ලද්දේ මන්ද යන්න විමසිය යුතුය. අෂ්ට මංගල හෝ මංගල සම්මත ලක්ෂණ දොරටුවක් ආශ්‍රිත ව තැබීම අති පුරාණ කාලයක පටන් මේ දක්වා පැවත එන සිරිතකි. මෙවැනි මංගල සම්මත වස්තු ලෙස තැන්පත් කරන්නට ඇතැයි සිතිය හැකි දිසාපාලක දෙවි රූපත් ,ඒ ඒ දෙවිවරුන් ආශ්‍රිත ඇත්, අස්, සිහ, ගව යන රූපත් විජයාරාමයේ දොරටු යට වළලා තිබී බෙල්ට හමු විය (ASCAR 1891 : හා 1896 :3). දොරටුවක ඉහළ ශ්‍රී සෞභාග්‍යයට හා වාසනාවට අධිගෘහිත දෙවඟන වූ ගජ ලක්ෂමියගේ රුවක් නෙලීමේ සිරිත, පසු රාජ්‍ය සමයන්ට අයත් ගල් උළුවහු රැසක් තුළින් දක්නට හැකි ය. දෙවන සියවසේ විසූ නෙඩුඤ්ජෙළ්ලිය නම් පාණ්ඩ්‍ය රජුට ප්‍රශස්ත කාව්‍යයක් වශයෙන් ඇතැම් විට ඊට සියවස් එකකට හෝ දෙකකට පසුව රචනා කරන්නට ඇති "මදුරයින් කාඤ්ජි" නම් දෙමළ කාව්‍යයේ දැක්වෙන පරිදි එම පාණ්ඩ්‍ය රජුගේ අග නගරයෙහි මහා වාසල් දොරටු කුළුණුවල ලක්ෂ්මී දේවියගේ රූ සටහන කොටා තිබිණි. (බෂාම් 1965: 268). මින් මේ සිරිතේ ඉපැරණි බව පිළිබඳ අදහසක් ගොඩනගා ගත හැකි ය. අෂ්ටමංගල ලක්ෂණවූ කලී අබෞද්ධ ප්‍රභවයක් සහිත වූ, එහෙත් පසුකාලීන බුදු සමය සමග සබඳවූ අංගයකි. "... .. යකුන් ඇදහීම සහ දේවතාවන් ඇදහීම සම්බන්ධ ලක්ෂණය වූ නැටුම් සහ ඇතැම් විට රඟපෑම් පවා චෛත්‍යය වන්දනාව සඳහා එවක වන විට යොදා ගෙන තිබුණි. කල්පවෘක්ෂ, නාගයන් හා දේවතාවන් බඳු පොදු පූජාවස්තූන්ගේ නිරූපණයන් සහිත වාහල්කඩ බුදුසමය සහ සිංහලයන් අතර ප්‍රචලිතව පැවති ප්‍රාග් - බෞද්ධ ඇදහිලි ක්‍රමයන් සම්බන්ධ කැරෙන වාස්තු විද්‍යාත්මක ප්‍රකාශණයක් බව පෙනේ. (පරණවිතාන 1969 :53)."

දොරටුවක් සංකේතවත් කෙරෙන වාහල්කඩක් බෞද්ධ ස්තූපයකට එක්කරන ලද්දේ මන්ද යන්න විමසිය යුතුය. ස්තූපය බෞද්ධ ඉගැන්වීම්වල පිළිබිඹුවක් බැව් ඇතමෙකුගේ අදහසයි. එසේ නොවුවද තූපයක අතිශයින් ම වැදගත් කොටස වී යැයි සැළකිය හැකි ධාතුගර්භයෙහි සර්වඥ ධාතු සමගින් බුදු සිරිත හා බුදු සමය නිරූපණය කෙරෙන පූජා වස්තූන් තැන්පත් කරනු ලැබ තිබිණි. එහෙත් මේ ධාතු ගර්භය තුළට හෝ දාගැබේ අවශේෂ කොටසක් තුළට හෝ සැදැහැවතාට පිවිසිය නොහැකි ය. එහෙත් සැදැහැවතා නමදිනුයේ එම නොපෙනෙන ගර්භයේ වූ පූජා වස්තූන්ටත්, දාගැබෙන් ප්‍රදර්ශණය වන ආගමික සංකේතයටත් ය. දාගැබට පිවිසෙනු සඳහා එහි මළුවේ සතර පසින් ඇති පියගැට පන්ති තරණය කළ සැදැහැවතාට එක එල්ලේම තමාට ඉදිරියෙන් දැකිය හැකිවනුයේ වාහල්කඩයි. වාහල්කඩ යනු දොරටුවයි, දොරටු දාගැබට යාව තනා තිබීමෙන් පෙනෙන්නේ වාහල්කඩ හෙවත් මෙම දොරටු තුළින් දාගැබ තුලට ප්‍රවේශය සළසා ගත හැකි බවයි. එසේ දාගැබ තුළට සැදැහැවතාට මෙසේ සංකේතානුකූලව හෝ ඇතුළුවිය හැකි නම් හෙතෙම ධාතු ගර්භයෙන් හා දාගැබෙන් ප්‍රදර්ශිත බුදු සිරිතටත්, බෞද්ධ සමයෙන් පිවිසියා වන්නේ ය.

මෙසේ දාගැබ සතර පස වාහල්කඩ සතරක් යෙදීමේ අරුත වන්නේ දාගැබෙන් පිළිබිඹු වන එම සංකේතාර්ථයට ව්‍යංගයෙන් සැදැහැවතා ඇතුළු කර ගැනීම යයි සිතිය හැකි ය. භාතික අභය රජුට රුවන්වැලි සෑ ධාතු ගර්භයෙන් පිරිත් දෙසන රහතුන්ගේ හඬ සවන් වැකුණු බව ද, ස්තූපයේ අභ්‍යන්තරය දැකගනු කැමතිවූ රජු, තම අදහස මුදුන් පමුණුවා ගනු පිණිස නොනැගිටිමියි සිතා නැගෙනහිර අද්දිකය පාමුල වැදහොත්තේ යැයි ද මහාවංසය සඳහන් කරයි.

රජුගේ මෙම සත්‍ය ක්‍රියාවෙන් දාගැබ තුළට යාමට දොරටුවක් විවර වූ බවත් රජු ගැබ තුළට පිවිස එය දැක බලා ගත් බවත් සඳහන් වේ. (මහාවංසය 34 පරි. 50 ගාථාව) "අද්දිකය" යනු "ආදිමුඛ" යන්නෙහි හා "ආයක" යන්නෙහිම ස්වරූපයක් විය හැකිය. එසේ නම් භාතිකාභය රජු දාගැබ් අභ්‍යන්තරයට යාමට අධිෂ්ඨාන කර වැදහොත්තේ නැගෙනහිර වාහල්කඩ පාමුල විය යුතුය. දොරටුවක් සංකේතවත් කරන මෙම වාහල්කඩ තුළින් රජු සංකේතාත්මකව ධාතු ගර්භය තුළට පිවිසෙන්නට ඇත. අද්දිකය යනු වාහල්කඩ ලෙස සැක හැර දැනගත හැකි නම් වාහල්කඩ යනු දොරටුවක මෙහෙයක් ඉටු කළ තැනක් බවට වූ අපගේ අදහස ද තහවුරු කොටගත හැකි වේ.

## 4. නිගමනය

මිහින්තලේ කණ්ඨක චෛතියේ දක්නට ලැබෙන වාහල්කඩ කැටයම් ක්‍රිස්තු වර්ෂ 1 -2 සියවස්වලට අයත් බව ආචාර්ය සෙනරත් පරණවිතානගේ අදහස වන අතර එම අදහස අනුමත කළ හැකි+වේ. එසේ වුවත් කණ්ඨක චෛතියේ වාහල්කඩ කැටයම් ඊට පෙර පැවති බොහෝ විට දැව වැනි දිරායන සුළු මාධ්‍යකින් කල කැටයම් සමහරකින් ආභාශය ලබා ඇති බව නිගමනය කළ හැක්කේ එක් වරම කණ්ඨක චෛති කැටයම් මට්ටමට වර්ධිත කැටයම් පැන නැගුණේ යයි අපේක්ෂා කළ නොහැකි බැවිනි. මකර ශීර්ෂධර දැවයෙන් කළ ගොනැස් පරාල වල අග කොටසින් ප්‍රභවය වූයේ යැයිද ඇතැම් වාහල්කඩවල ඉහළින් ම කැටයම් කර ඇති බෞද්ධ ගරාදිවැට දැවමය මූලාදර්ශවලින් පැන නැගුනේ යැයි ද සිතීමට හැකියාව තිබේ.

වාහල්කඩක සංකේතාර්තය හෝ භාවිතය පිළිබඳ මත කිහිපයක් ඉදිරිපත්ව තිබේ. පරණවිතානගේ මතය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

වනුයේ මේවා මගින් මහා+මේරුවේ පැති හතර නිරූපණය වන බවයි. ජේ. ජී. ස්මිදර් පවසන්නේ වාහල්කඩ ඉදි වීමට පෙර දාගැබ වටා වූ ප්‍රදක්ශිනා පථයට ගොඩවීමට තිබූ පියගැටපේළි උපක්‍රමශීලී ලෙස වසා දැමීමට වාහල්කඩ ඉදිවූ බවයි. තවත් මතයකින් කියවෙන්නේ වාහල්කඩ ඉදිරියේ ඇති ගල් ආසනයට අලංකාර පසුබිමක් ගෙන දෙනු පිණිස වාහල්කඩ ඉදිවූ බවයි.

මාගේ අදහස එකී අදහස් සියල්ල කෙරෙන් වෙනස් ය. වාහල්කඩෙහි වඩා වැදගත් කොටස මුදුනේම ගඩොලින් නිර්මාණය කර ඇති ගොඩනැගිල්ල බවත්, ත්‍රිත්ව ද්වාර ලෙස හැඳින්විය හැකි මේ දොරටු සීගිරිය වැනි තැන්හි ප්‍රායෝගිකවම හමුවන බවත් ය. වාහල්කඩ මත නිරූපණය කොට ඇති ගොඩනැගිල්ල ප්‍රාකාරයකට සම්බන්ධ අංගයක් බව පරනවිතාන පිළිගනී. මෙකී කොටසින් දිව්‍ය විමානයක් පෙන්වීමට ශිල්පියාට අවශ්‍ය වී නම් විමානයේ ද්වාර පමණක් නොදක්වා දිව්‍ය විමානයකට අවශ්‍ය ජනේල සඳළු+තලද පෙන්වනු ඇතැයි සාධාරණ ලෙස සිතිය හැකි ය. එයින් ද මෙය දොරටුවක් බව තහවුරු වෙයි. තව ද චීනය හා අග්නිදිග ආසියාතික රටවල ප්‍රාකාරවලට අනුබද්ධ කොට තැනූ ත්‍රිත්ව ද්වාර මේ වන තෙක් ම සුරැකිව තිබේ. මේවා එකිනෙක අතර ජාත්‍යන්තර ආභාශයන් තිබීමටත් නොඑසේ නම් ලාංකේය ත්‍රිත්ව දොරටු ස්වීයව පහල වූ අදහසක් වීමටත් ඉඩ ඇත.

වාහල්කඩ හැඳින්වීම සඳහා මහාවංසය ඇතුලු පැරණි මූලාශය භාවිත කරන වචන වූයේ අයක, ආදිමුඛ, අද්දික යනාදියයි. මේ වචනවල අරුත ද පරණවිතාන විසින් ද නිවැරදි ලෙසම පෙන්වා දෙන පරිදි දොරටුව යනුයි. මෙමගින් ද මාගේ මතය තහවුරු කෙරෙයි. වර්තමානයේ මේ අංගය හැඳින්වීමට යෙදෙන වාහල්කඩ යන්නේ අරුත ද දොරටුව යනුයි.

පැරණි දොරටු හා උළුවහුවල ඉහලින් සෞභාග්‍යයට අධිපති දෙවඟනක් වූ ලක්ෂ්මී දෙවඟන දෙපස ඇත් යුගලය සහිත ව හෝ රහිත ව නෙලා තිබෙනු දක්නට හැකි ය. දොරටුව තුළින් ගමන් ගන්නාට සෞභාග්‍ය ප්‍රාර්ථනා කිරීම එහි අරමුණයි. බුද්ධ ප්‍රතිමාවේ පාදවලට යටිනුත් අනුරාධපුරයේ විජයාරාමයේ දොරටු යටිනුත් අෂ්ට මංගලවලට සම්බන්ධ ශ්‍රී වත්සය, අංකුසය, පූර්ණ ඝටය, ස්වස්තිකය හා එම සකේත හා බැඳෙන ඇත්, අස්, සිහ, ගව යන සතුනුත් දිසා පාලක දෙවිවරුනුත් සියල්ල හෝ කිහිපයක් වශයෙන් හමුවේ.

අෂ්ඨ මංගල ලක්ෂණ හා බැඳෙන මේ ලක්ෂණ සියල්ල වාහල්කඩ කැටයම් වලට අන්තර්ගත වේ. වාහල්කඩ දෙපස ඇති කැටයම් කළ කණු මත එක් පසෙකට එක් සතා බැගින් එක් එක් පසෙහි ඇත්, අස්, සිහ, ගව යන සිපාවුන් සිවුදෙනාත්, එම කණුවලම කැටයම් අතර එකී සිවුපාවුන්, පූර්ණඝඨය හා ධනයට අධිපති දෙවියා වන කුවේර රූපයත් නෙලා තිබේ. මෙම කණු යොදා තිබෙන්නේ වාහල්කඩ දෙපසින් ද්වාරයක දොරබා සිහි ගන්වන අයුරිනි.

මීලඟට මතුවන ගැටලුව වන්නේ දාගැබ් සිවු පස දොරටු සිහිගන්වන පරිදි වාහල්කඩ නිර්මාණය කළේ ඇයිද යනුයි. දාගැබ යනු බුදුන්ගේ ශාරීරික ධාතු නිදන් කල බොදු සිහිවටනයයි. ධාතු තැන්පත් කර ඇත්තේ දාගැබක ධාතු ගර්භයේයි. ඒ අනුව සැදැහැවතා නමදිනුයේ දා ගැබක ධාතු ගර්භයේ ඇති සර්වඥ ධාතු වලටයි. එහෙත් සැදැහැවතාට තමන් නමදින සර්වඥ ධාතු කරා ලඟා විය නොහැකි වේ. එබැවින් සංකේතානුසාරයෙන් සැදැහැවතාට දාගැබ් ධාතු ගර්භයට පිවිසෙනු පිණිස දොරටු නිමවීම බලාපොරොත්තු විය හැකි යයි. භාතිකාභය රජු ගර්භයට යනු රිසිව රුවන්වැලිසෑයේ නැගෙනහිර අද්දිකය පාමුල වැදහොත්තේ යැයි කීමෙන් අදහස් කරන්නට ඇත්තේ අභිනයෙන් දාගැබ් ගර්භයට අවතීර්ණ වීමක් වන්නට පුළුවන.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි


*ධාතුවංසය*, පියරතන හිමි, මකුළුදුවේ (සංස්), කොළඹ, 1941.

*මහාවංසය*, සුමංගල හිමි, හික්කඩුවේ; දේවරක්ඛිත, බී. (සංස්), රත්නාකර පොත් වෙළඳ ශාලාව, මරදාන, 1967.

දිසානායක, සෙනරත්, 1986, "*සීගිරි විනෝද උයනේ ගොඩනැගිලි*'' දේශණ පත්‍රිකාව, කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය පර්ෂදය.

1987, *මිහින්තලේ කණ්ඨක චේතියේ වාහල්කඩ*, යතුරු ලියනය කළ විද්‍යාපති උපාධි වාර නිබන්ධය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

පරණවිතාන, එස්. 1963, *ලංකාවේ ස්තූපය* (සිංහල පරි), රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ.

බෂාම්, ඒ. එල්. 1965, *අසිරිමත් ඉන්දියාව* (සිංහල පරි.), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව කොළඹ.

Bachhofer, L.1965, ***Early Indian Sculpture***, Vol. I, London.

Barrett, Douglas, 1954, ***Sculptures from Amarawati in the British Museum***, London.

Bopearachchi, Osmund, 2020, ***Roots of Sri Lankan Art***, Department of Archaeology

Karunaratne, T. B. 1971, "Astamangala (The Eight Auspicious Symbols)" ***JRASCB*** (n.s.), Vol. XV.

Prematilaka, L. 1980, "The Sculptural Remains of the Stupa Vahalkada," PP. 320-337, ***Deraniyagala Commemoration Volume***, Lakehouse investment limited, Colombo. Leiden

Paranavitana, S. 1954, "The Significance of Sinhalese "Moonstones", PP,197-321, ***Artibus Asiae***, Vol. 17, Nos. 3-4.

Rowland, B.1959, ***The Art and Architecture of India***, Penguin Books

Smither, J. G. 1897, ***Architectural remains at Anuradhapura***, London.

ASCAR -Archaeological Survey of Ceylon, Annual Report

EZ-Archaeological Survey of Sri Lanka, Vol. I.





*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk

The Journal of
Archaeology & Heritage Studies
Journal Home page https://fssh.rjt.ac.lk/index.php/jahs-about/

Research Paper

# Enhancing Child Education through Positively Organizing Museums

**Piyumi Ambuldeniya**[1] **Buddhisha Weerasuriya**[2]

[1] **Piyumi Embuldeniya,** Department of Archaeology, Faculty of Arts, University of Peradeniya, Sri Lanka piyumie@arts.pdn.ac.lk

[2] **Buddisha Weerasuriya,** Department of Archaeology, Faculty of Arts, University of Peradeniya, Sri Lanka buddisha@pgihs.ac.lk

ARTICLE INFO

***Article History:***
Received 31 December 2022
Accepted 31 May 2023
Available online 01 October 2023

ABSTRACT

Museums are not just exhibiting artifacts. According to the new museological concepts, it has different meanings, objectives, and functions. This study has developed a concept that helps to improve child education through museums as its main objective. Further, this study emphasized the importance of implementing the educational modules and methods that are currently being used in the museums located around the world for the education of Sri Lanka through the museums. This research is based on the collected data through the mixed-methods approach and firsthand experiences gained through participatory observations. This study focused on theories connected with museology, child education, and child psychology. These theories supported the development of an effective new model that benefits ethnic harmony, empathy, thinking based on equality, nationality, and a better future through personality development, critical thinking, education, and enjoyment with the inputs of experiences, sensuality, knowledge, and information that could provide through museums.

**Key words:** *Children, Child psycology, Education, Museum*

## ළමා අධ්‍යාපනය කෙරෙහි ධනාත්මක ලෙස කෞතුකාගාර සංවිධානය කිරීමේ වැදගත්කම

### 1.හැඳින්වීම

වර්තමානයේ දී කෞතුකාගාර කාර්‍යයමය වශයෙන් සහ සංකල්පමය වශයෙන් විවිධ දිශානතීන් වෙත යොමු වී තිබේ. කෞතුකාගාර හුදෙක් පුරාවස්තු ප්‍රදර්ශනය කරන හෝ පුරාවස්තු ගබඩා කර තිබෙන ගොඩනැගිල්ලක් නොවන අතර කෞතුකාගාර ඔස්සේ අධ්‍යාපනය ලබා දීම ප්‍රමුඛ වේ. මෙම පර්යේෂණ ලිපිය මගින් අවධානය යොමුකෙරෙන්නේ කෞතුකාගාර නව අධ්‍යාපනික ආකෘතියක් ලෙස ළමයාට සමීප කරවීමේ ක්‍රමවේද පිළිබඳවයි. නූතන ලෝකයේ ජනප්‍රිය ලෙස ක්‍රියාත්මකවන කෞතුකාගාර සම්බන්ධ අධ්‍යාපනික ආකෘති සහ ක්‍රමවේද වඩා උචිත පරිදි ශ්‍රී ලංකාවේ භාවිත කිරීමේ අවශ්‍යතාවය මෙමගින් තවදුරටත් සාකච්ඡා කෙරෙයි.

### කෞතුකාගාරයක් යනු

ජාත්‍යන්තර කෞතුකාගාර සංගමය (International Council of Museums - ICOM) මගින් "කෞතුකාගාරය" පිළිබඳ නිර්වචන ඉදිරිපත්කර ඇත. ඒ අනුව වර්ෂ 2022 දී ජාත්‍යන්තර කෞතුකාගාර සංගමය මගින් " කෞතුකාගාරය" යන්න සඳහා ඉදිරිපත්කර තිබූ නිර්වචනය යාවත්කාලීන කර ඇත. ඒ අනුව

කෞතුකාගාරයක් යනු, ස්පර්ශිත සහ අස්පර්ශිත උරුමයන් පිළිබඳ පර්යේෂණ, එක්රැස් කිරීම, සංරක්ෂණය, අර්ථකථනය, සහ ප්‍රදර්ශනය සිදුකරනු ලබන සමාජ සේවයට කැපවූ ලාභ නොලබන ස්ථිර ආයතනයකි. මහජනතාවට විවෘතවූ කෞතුකාගාර මගින් විවිධත්වය සහ තිරසාරත්වය පෝෂණය කරයි. කෞතුකාගාර ආචාරධර්මානුකූලව, වෘත්තීයමය වශයෙන් මෙන්ම ප්‍රජා සහභාගිත්වයක් සහිතව ක්‍රියාත්මක වන අතර අධ්‍යාපනය, රසවින්දනය, ආවර්ජනය, සහ දැනුම බෙදාගැනීම සඳහාවූ විවිධ අත්දැකීම් සන්නිවේදනය කරනු ලබයි"

> A museum is a not-for-profit, permanent institution in the service of society that researches, collects, conserves, interprets and exhibits tangible and intangible heritage. Open to the public, accessible and inclusive, museums foster diversity and sustainability. They operate and communicate ethically, professionally and with the participation of communities, offering varied experiences for education, enjoyment, reflection and knowledge sharing."



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

(In, on, the Extraordinary General Assembly of ICOM, Prague, 24th August 2022)

මෙම නිර්වචනයට අනුව කෞතුකාගාර සතු ප්‍රධාන කාර්යයභාරයන් ලෙස ස්පර්ශිත සහ අස්පර්ශිත උරුමයන් එක්රැස්කිරීම, ලේඛනගත කිරීම, සංරක්ෂණය කිරීම, පර්යේෂණ කිරීම, ප්‍රදර්ශනය කිරීම, අධ්‍යාපනය ලබාදීම, සහ ආරක්ෂා කිරීම ආදිය හඳුනාගත හැකිය. මේ අතුරින් අධ්‍යාපනය ලබාදීම ඉතා වැදගත් කෞතුකාගාර කාර්යයභාරයක් වශයෙන් සැලකිය හැකිය. කෞතුකාගාර යනු අධ්‍යයනයට-අධ්‍යාපනයට පවත්වගෙනයනු ලබන ස්ථිර ආයතනයක් බව නිර්වචනය තුළ සඳහන් වීම හරහා ම කෞතුකාගාර මගින් අධ්‍යාපනය ලබාදීම ඉතා වැදගත්වන බව පැහැදිලි වේ.

**අධ්‍යාපනය හා කෞතුකාගාරය**

අධ්‍යාපනය යනු මිනිසුන්ගේ හදවත සහ මනස සමග සම්බන්ධවූවකි. එසේම අධ්‍යාපනය යනු සදාචාරාත්මක, භෞතික, බුද්ධිමය, විද්‍යාත්මක වටිනාකම් සහ දැනුම සංවර්ධනය කරගැනීමේ ක්‍රියාවලියයි (Key Concepts of Museology, 2010: 31) එසේම Key Concepts of Museology නම් ග්‍රන්ථයෙහි තවදුරටත් අධ්‍යාපනය යන්න පැහැදිලිකර ඇති ආකාරය පහත පරිදි උපුටා දැක්විය හැකිය.

> "කෞතුකාගාර සංකල්පය තුළ අධ්‍යාපනය යනු කෞතුකාගාර ඇසුරෙන් පැනනැගුණු දැනුම සංවිධානාත්මකව ඉදිරිපත්කිරීම, සහ නව අත්දැකීම් සම්බන්ධයෙන් නව සංවේදීතාවයන් සහ වටහාගැනීම් සංවර්ධනය කරගැනීම ඔස්සේ පුද්ගලයින්ගේ සංවර්ධනය සහ පරිපූර්ණත්වය ගොඩනැංවීමට කෞතුකාගාර ඇසුරෙන් ලැබෙන දැනුම උකහාගැනීම බව හඳුනාගත හැකිය (ibib:31)".

Key Concepts of Museology (2010), ග්‍රන්ථයේ තවදුරටත් සඳහන්වනුයේ අධ්‍යාපනය යනුවෙන් අර්ථවත් කෙරෙන්නේ, මිනිසා පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම මෙන් ම ඔවුන්ගේ හැකියාවන් වඩාත් පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා උචිත ක්‍රමවේද හඳුන්වාදීමය. එසේම, කෞතුකාගාර අධ්‍යාපනය විවිධ අගයන්, සංකල්ප, දැනුම සහ පරිචයන්ගේ එකතුවකින් සමන්විතවන අතර එය කෞතුකාගාර නරඹන්නන් සංවර්ධනය කිරීම සහතික කරනු ලබයි. අධ්‍යාපනය අනිවාර්යයෙන් ම හදවත සහ මොළය සමග බද්ධ වී ඇත. එසේම, අධ්‍යාපනය මගින් ආචාරධාර්මික සංවර්ධනය මෙන් ම ඉන්ද්‍රියගෝචර, බුද්ධිමය, සහ විද්‍යාත්මක අගයන් ද පෝෂණය කරයි. එහෙයින් කෞතුකාගාර අධ්‍යාපනික ක්‍රමවේද සහ ආකෘති නිර්මාණය කිරීමේ දී දැනුම සහ ආකල්ප සංවර්ධනය කෙරෙහි උචිත ලෙස සකස් විය යුතු ය.

විශේෂයෙන් කෞතුකාගාරයක් මගින් අධ්‍යාපනය ලබාදීම සඳහා දෙයාකාරයකින් දායකත්වය ලබාදීම සිදුවේ.

01. විධිමත් අධ්‍යාපනය (Formal Education)

02. අවිධිමත් අධ්‍යාපනය (Informal Education/ Informal Learning)

කෞතුකාගාර මගින් මෙවැනි අධ්‍යාපනික කාර්යයක් ඉටුකිරීමේදී කෞතුකාගාර ඉතා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම වැදගත්වේ (Ambrose & Paine, 2006: 9-10);

කෞතුකාගාර පිළිබඳ පූර්ණ ක්‍රියාවලිය එනම්, එක්රැස්කිරීම, ප්‍රලේඛනය, සංරක්ෂණය, හා පර්යේෂණ අවසන්වන්නේ නව දැනුමක් ලබාගැනීමෙනි. මෙම නව දැනුම චිරාගත මාධ්‍යය වූ ශාස්ත්‍රීය ප්‍රකාශන මගින් විද්වතුන් හා විද්‍යාඥයින් අතර වරින්වර බෙදාහැරීමට ක්‍රියාකරනු ලබයි. අධ්‍යාපනික දැනීම හුවමාරුකරගැනීම සඳහා බලවත් ආධාරකයක් වශයෙන් කෞතුකාගාර මාධ්‍යය යොදාගැනීම විසිවන සියවසෙහි ඇති වූ විශේෂ සිදුවීමකි. වර්තමානය වනවිට වෙනත් කිසිදු කාලයකට වඩා අධ්‍යාපන සහ කෞතුකාගාර විශේෂඥවරු අතර කෞතුකාගාරවල අධ්‍යාපන වැදගත්කම පිළිබඳ මනා අවබෝධයක් පවතියි. එහෙයින් කෞතුකාගාරය සමාජය, සංස්කෘතිය, විද්‍යාව, සහ කාර්මිකවිද්‍යාව පිළිබඳ ජාතියේ උරුමය ආරක්ෂාකරන මධ්‍යස්ථාන පමණක් නොව සමස්ත සමාජයට අධ්‍යාපනය සලසන මධ්‍යස්ථාන වේ (ද සිල්වා, 1996:94).

ඇමරිකානු කෞතුකාගාර සංගමය (American Association of Museums) හෙවත් වර්ථමානයේ දී ඇමරිකානු කෞතුකාගාර සන්ධානය (American Alliance of Museums) නමින් හඳුන්වන ආයතනය මගින් ඉදිරිපත්කර ඇති කෞතුකාගාර ආචාරධර්ම අතර කෞතුකාගාර හරහා දැනුම ප්‍රවර්ධනය කළ යුතු බව දැක්වේ. එම නිර්වචනයේ අර්ථය අනුව කෞතුකාගාර එහි ප්‍රදර්ශනය කරනු ලබන ලෝකයේ ස්වභාවික සහ සංස්කෘතික උරුමයන් කෙරෙහි අවධානය යොමුකර ස්වභාවික සාධක පිළිබඳව සහ මානව අත්දැකීම් පිළිබඳව වටහාගත යුතු බවත් ඒ හරහා දැනුම සම්ප්‍රේෂණය කළ යුතු බවත් දක්වා ඇත.

කෞතුකාගාර සංකල්පය තුළ අධ්‍යාපනය යනු කෞතුකාගාර ඇසුරෙන් පැනනැගුණු දැනුම සංවිධානාත්මකව ඉදිරිපත් කිරීම, සහ නව අත්දැකීම් සම්බන්ධයෙන් නව සංවේදීතාවයන් සහ වටහාගැනීම් සංවර්ධනය කරගැනීම හරහා පුද්ගලයින්ගේ සංවර්ධනය සහ පරිපූර්ණත්වය ගොඩනැංවීමට කෞතුකාගාර ඇසුරෙන් ලැබෙන දැනුම උකහාගැනීමය (Key Concepts of Museology, 2010:31) දැනුම ප්‍රවර්ධනය සහ මානව ජීවිතය පෝෂණය කිරීම සඳහා කෞතුකාගාර සතු ඉතා වැදගත් සම්පත් භාවිත කිරීමට සෑම කෞතුකාගාරයක්ම කැප වී සිටියි. එසේ ම කෞතුකාගාර හරහා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට සෑම කෞතුකාගාරයකම කෞතුකාගාර භාරකරුවන්, කාර්යය මණ්ඩලය, සහ ස්වේච්ඡා කාර්යය මණ්ඩලය එක්ව කටයුතු කළ යුතු වේ (Excellence in Practice: Museum Education Principles and Standards, 2005: 6).

සියලුම කෞතුකාගාරවල භාරකරුවන්, කාර්යය මණ්ඩලය, සහ ස්වේච්ඡා කාර්යය මණ්ඩලය විසින් නිරවද්‍යතාවයෙන් යුක්තව, පැහැදිලි ලෙස සහ අදාළත්වයෙන් යුක්තව කෞතුකාගාරය සතු අධ්‍යාපනික සම්පත් ජනතාව අතරට රැගෙනයාමට හැකිවන පරිදි


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

කෞතුකාගාර මෙහෙවර ප්‍රකාශය සකස්කළ යුතු ය. විවිධ අදහස් සහ ප්‍රකාශන සපයාගැනීම, නරඹන්නන් වෙත කෞතුකාගාරය මගින් ලබාදෙන අධ්‍යාපනය සම්බන්ධයෙන් සහ ඒ කෙරෙහි කෞතුකාගාරයේ බලපෑම සම්බන්ධයෙන් තොරතුරු රැස්කිරීම, දැනුම වර්ධනය කරගැනීමට සහ ස්වයං අධ්‍යයනවල යෙදීම සඳහා අවශ්‍ය තාක්ෂණික ඥානය සහතික කිරීම, සහ කෞතුකාගාර පරිසරය තුළ ආයතනික ප්‍රතිපත්ති, වැඩසටහන් සහ නිර්මාණ සම්බන්ධයෙන් ගෞරවාන්විත බව සහතික කිරීම යන සාධක කෙරෙහි ද සියලුම කෞතුකාගාරවල භාරකරුවන්, කාර්යය මණ්ඩලය, සහ ස්වේච්ඡා කාර්යය මණ්ඩලය විසින් අවධානය යොමුකළ යුතු වේ (ibib: 6).

ජී. ආර්. දිසානායක විසින් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර හා සන්නිවේදනය නම් කෘතියෙහි සඳහන්කර ඇත්තේ " කෞතුකාගාර ආරම්භක සමයේ දී ඒවා භාණ්ඩ එක්රැස්කරන තැනක්වුව ද 1960 ගණන්වලින් පසුව ඒවායේ පරමාර්ථ වෙනස් විය. එනම් අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස භාවිත කිරීමට පටන්ගත්තේ පසුකාලයේදීය. විශේෂයෙන් 1996 වර්ෂයේදී කෝපන්හේගන්හි පැවැත්වූ ජාත්‍යන්තර කෞතුකාගාර සම්මේලනයේදී කෞතුකාගාර අධ්‍යාපනයේ වැදගත්කම ගැන අවධානය යොමුකරන ලදී." යනුවෙනි. එසේ ම මෙහි සඳහන්වනුයේ යුනෙස්කෝ සංවිධානය මගින් කෞතුකාගාර නරඹන්නන්; යම් විෂයයක් සම්බන්ධව ප්‍රායෝගික දැනුමක් ඇති වැඩිහිටි අය; වැඩිහිටි සාමාන්‍ය නරඹන්නන්, සහ ළමා නරඹන්නන් වශයෙන් කොටස් තුනකට බෙදා දක්වන බවයි (දිසානායක, 1999: 80).

ඉගෙනීම යනු කරුණු පමණක් නොවන අතර එයට අත්දැකීම් සහ හැඟීම් ද ඇතුළත් වන බැවින් කෞතුකාගාර හරහා නරඹන්නන් රැසකට අධ්‍යාපනය ලබාදීමට හැකියාව ලැබේ. යමක් ඉගෙනීම සමාජ අත්දැකීමක් ලෙස මතක තබා ගැනීම ද වැදගත්වන අතර ඒ කෙරෙහි කෞතුකාගාර සෘජු ලෙසම දායක වේ. කෞතුකාගාර මගින් නරඹන්නන්හට තමන්ට අවශ්‍ය ලෙස කෞතුක භාණ්ඩ අත්විඳිමින් අධ්‍යාපනය ලබාගැනීමට අවකාශය සැලසෙන බැවින් කෞතුකාගාර මගින් ලැබෙන අධ්‍යාපනය "Free-choice learning" ලෙස ද හඳුන්වනු ලබයි (Ambrose & Paine, 2006: 46).

ඉහත න්‍යායාත්මක කරුණු ආශ්‍රයෙන් සනාථ වන්නේ කෞතුකාගාර සහ අධ්‍යාපනය යනු එකිනෙක බද්ධ වූ සංකල්ප ද්වයක් බවයි.

**කෞතුකාගාරය අධ්‍යාපනික මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මකවන ආකාරය**

කෞතුකාගාර අධ්‍යාපනික මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාත්මකවීමේදී විවිධ ඉගෙනුම් න්‍යායයන් සහ අධ්‍යාපන ක්‍රමවේද භාවිත කරනු ලබයි. කෞතුකාගාර මගින් පවත්වනු ලබන අධ්‍යාපන වැඩසටහන් පහත පරිදි දැක්විය හැකිය.

- දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ, ව්‍යාපෘති
- මාර්ගෝපදේශන සේවා
- මහජන වැඩසටහන්
- ප්‍රදර්ශන
- ප්‍රකාශන කෞතුකාගාර මගින් විවිධ විෂයයන් හෝ විශේෂිත පර්යේෂණ පිළිබඳව ප්‍රකාශයට පත්කරනු ලබන ග්‍රන්ථ, අත්පත්‍රිකා
- ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන්
- අධ්‍යාපනික ගුවන්විදුලි සහ රූපවාහිනී වැඩසටහන්
- වැඩිහිටි සාක්ෂරතා වැඩපිළිවෙළවල්
- විශ්වවිද්‍යාල සිසුන් සඳහා වැඩමුළු
- තැපැල් මාර්ගික පාඨමාලා
- බහුසංස්කෘතික කටයුතු සහ අධ්‍යාපනික කව සංවිධානය කිරීම

කෞතුකාගාර මගින් පවත්වනු ලබන අධ්‍යාපන වැඩසටහන් විවිධ වයස් කාණ්ඩවල පිරිස සඳහා ත් විවිධ අධ්‍යාපන මට්ටම්වල පිරිස සඳහා ත් විවිධ බුද්ධි මට්ටම්වල පිරිස සඳහා ත් විශේෂ අවශ්‍යතා ඇති පිරිස සඳහා ත් (මානසික සහ ශාරීරික වශයෙන් විශේෂ අවශ්‍යතා සහිත පිරිස) ආදී වශයෙන් එක් එක් කණ්ඩායම්වලට උචිත පරිදි නිර්මාණයකර ඇත. ඒ අනුව කෞතුකාගාර මගින් අධ්‍යාපන වැඩසටහන් සංවිධානය කිරීමේදී අදාළ අධ්‍යාපන වැඩසටහන සඳහා ඉලක්කගත පිරිස, වයස මට්ටම, රුචිකත්වය, අධ්‍යාපන මට්ටම යන සාධක කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලබයි. විශේෂයෙන් පාසල් සිසුන් සහ ගුරුවරුන් සඳහා මෙම අධ්‍යාපන වැඩසටහන් පවත්වනු ලබයි. එසේ ම පවුලේ සාමාජිකයින් සඳහා විශේෂිතවූ කෞතුකාගාර අධ්‍යාපන වැඩසටහන් ද කෞතුකාගාර මගින් සංවිධානය කරනු ලබයි. එමෙන් ම රාත්‍රී කාලවලදී කෞතුකාගාර තුළ රැඳීසිටිමින් විවිධ අංශ පිළිබඳ අධ්‍යාපනය ලබාදීම, ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරෙන් අධ්‍යාපනය ලබාදීම, දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් මගින් අධ්‍යාපනය ලබාදීම ආදී අධ්‍යාපන ක්‍රමවේද කෞතුකාගාර මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

**ළමා අධ්‍යාපනය කෙරෙහි කෞතුකාගාර**

යුනිසෙෆ් (UNICEF) අර්ථ දැක්වීමට අනුව, නෛතිකමය වශයෙන් ළමයා යනුවෙන් අදහස් කෙරෙන්නේ උපතේ සිට වයස අවුරුදු දහඅට දක්වා කාල පාරාසයකට අයත් පිරිසයි . ළමයාගේ වර්ධනය අනුව මුල් ළමාවිය, මධ්‍යම ළමාවිය සහ නව යොවුන්විය වශයෙන් ප්‍රධාන වශයෙන් කොටස් තුනකි. මේ එක් එක් අදියේදී ළමයා සතු හැකියාවන් විවිධ වන අතර ඒ ඒ වයස් කාණ්ඩ අනුව ළමයින්ගේ පෙළඹවීම්, හැසිරීම්, උත්තේජන සහ ප්‍රතිචාර දැක්වීම් ද වෙනස් වේ. එම නිසා කෞතුකාගාර, ළමා අධ්‍යාපනය කෙරෙහි භාවිත කිරීමේදී ඉහත දැක්වූ එක් එක් වයස් කාණ්ඩ කෙරෙහි වෙන් වෙන් වශයෙන් අවධානයක් යොමු කළ යුතු වේ.

ළමා අධ්‍යාපනය වෙනුවෙන් සකස් වූ විශේෂ කෞතුකාගාර පිළිබඳ අත්දැකීම් ජාත්‍යන්තර උදාහරණ මගින් නිරීක්ෂණය කළ හැකි අතර එම වැඩසටහන් මාදිලි පිළිබඳ මෙහිදී සුවිශේෂී අවධානයක් යොමු කිරීම වැදගත් වේ. ගෝලීය උදාහරණ ලෙස නවදිල්ලි ජාතික කෞතුකාගාරය, මෙට්‍රොපොලිටන් කෞතුකාගාරය, ලන්ඩනයේ ස්වභාවිකවිද්‍යා කෞතුකාගාරය, සහ ලූවර් කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනය වෙනුවෙන්


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

වෙන් වූ ක්‍රියාකාරකම් සහ සංකල්ප පිළිබඳව පහත පරිදි දැක්විය හැකිය.

- නවදිල්ලි ජාතික කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනික වැඩසටහන් (ඡායාරූපය 01)
  - විෂයානුබද්ධව ස්ථිර ප්‍රදර්ශනය සැළසුම් කර තිබීම සහ විවිධ තේමාවන් යටතේ තාවකාලික ප්‍රදර්ශන පැවැත්වීම
  - කෞතුකාගාර ප්‍රකාශන අංශය යටතේ විවිධ අධ්‍යාපනික ප්‍රකාශන සිදු කිරීම (පර්යේෂණ ප්‍රකාශන, මාර්ගෝපදේශන ග්‍රන්ථ, මැදිරි පත්‍රිකා, ප්‍රදර්ශන මැදිරි සම්බන්ධ අත්පත්‍රිකා, කෞතුකාගාර ප්‍රදර්ශන සූචිය, ක්‍රියාකාරකම් පොත්, ඡායාරූප සහිත තැපැල්පත්, E- Books)
  - Playtime at the NM අධ්‍යාපනික වැඩසටහන
  - A Day at the Museum අධ්‍යාපනික වැඩසටහන
  - Yuva Saathi අධ්‍යාපනික වැඩසටහන (මෙම අධ්‍යාපනික වැඩසටහන මගින් කිසිදු මුදලක් අයකිරීමෙන් තොරව කෞතුකාගාරය තුළ මාර්ගෝපදේශන කටයුතු සිදුකරනු ලබයි. මේ සඳහා ස්වේච්ඡා සේවයට කැප වූ පුහුණු මාර්ගෝපදේශකයින් යොමුව ඇත. එ මගින් අර්ථවත් සහ විනෝදයෙන් පිරුණු කෞතුකාගාර චාරිකාවක් සඳහා අවස්ථාව උදාවන අතර ම දැනුම වර්ධනය කරගැනීමට ද අවස්ථාව උදාවේ)
  - නිල වෙබ් අඩවිය ඔස්සේ ළමයින් වෙත ඉදිරිපත් කරන වැඩසටහන්
- මෙට්‍රොපොලිටන් කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනික වැඩසටහන් (ඡායාරූපය 02, ඡායාරූපය 03)
  - #MetKids වැඩසටහන
  - #MetKids & Families වැඩසටහන
  - විෂයානුබද්ධව ස්ථිර ප්‍රදර්ශනය සැළසුම් කර තිබීම සහ විවිධ තේමාවන් යටතේ තාවකාලික ප්‍රදර්ශන පැවැත්වීම.
  - වෙබ් අඩවිය ඔස්සේ ළමයින් වෙත ඉදිරිපත් කරන වැඩසටහන්
- ලන්ඩනයේ ස්වභාවිකවිද්‍යා කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනික වැඩසටහන් (ඡායාරූපය 04)
  - මාර්ගගත යෙදවුම් (Online app.)
  - කෞතුකාගාරයෙන් පිටත සිදුකරන ප්‍රායෝගික අධ්‍යාපනික ක්‍රියාකාරකම්
  - මාර්ගගත දත්ත සංචිත - Natural History Museum (2017). Dataset: Collection specimens
  - පුහුණු වැඩසටහන් කෞතුකාගාරයේ පර්යේෂණවලට සමගාමී ලෙස කෞතුකාගාරයෙන් පිටතදී ස්වභාවිකවිද්‍යා ආදර්ශක අධ්‍යයනය කිරීම සඳහා තරඹන්නන්හට අවස්ථාව සලසාදීම
  - තරග - Wildlife Photographer of the Year competition
  - විවිධ වයස් කාණ්ඩ සඳහා වෙන්වූ වැඩසටහන් සියලුම වයස් කාණ්ඩවල සිසුන් සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් අන්තර්ගත අධ්‍යාපනික වැඩසටහන්
- ලූවර් කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනික වැඩසටහන් (ඡායාරූපය 05)
  - ළමයින් සඳහා වෙන්වූ විශේෂිත වැඩසටහන් සහිත වෙබ් අඩවිය (A Closer Look, Tales of the Museum, Through Children's Eyes)
  - මාර්ගගත ප්‍රදර්ශන (කෞතුක භාණ්ඩ පිළිබඳව නිර්මාණය කළ විශේෂිත වීඩියෝ දර්ශන සහ පැහැදිලිකිරීම් අන්තර්ගතව මාර්ගගත ප්‍රදර්ශන නිර්මාණය කර ඇත)
  - මාර්ගගත එකතුන් (Online Collections - Ancient Near Eastern Terracottas British Archaeology Brass Rubbings Collection)
  - වාර්තාමය වැඩසටහන් සහ කතාන්දර වැඩසටහන් (Masterpieces, In Search of Ideal Beauty Masterpieces, Accessible Visitor Trail)
  - සිතියම් සහ මාර්ගෝපදේශන පත්‍රිකා (ළමුන් සහ පවුලේ පිරිස සඳහා සකස් කළ විශේෂ මාර්ගෝපදේශන පත්‍රිකා)

**කෞතුකාගාර ළමා අධ්‍යාපනය සඳහා බලපෑම් කාරකයක් ලෙස**

කෞතුකාගාරයක් මගින් සිදුවන සමාජ සහ සංස්කෘතික දායකත්වයක් වශයෙන් අධ්‍යාපනික ආයතන හා සම්බන්ධ වී කටයුතු කිරීම දැක්විය හැකිය. මෙහිදී කෞතුකාගාරයක් මගින් සියලු ම වයස් කාණ්ඩවලට අයත් සිසුන් සඳහා කෞතුක භාණ්ඩ ඇසුරින් අධ්‍යාපනය ලබාගැනීමට අවශ්‍ය අවකාශය නිර්මාණය කිරීම සිදුවේ.

ඉගෙනීම කෙරෙහි දායකත්වය සපයන ආයතනයක් වශයෙන් කෞතුකාගාර මගින් සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සම්බන්ධ ද්‍රව්‍යයන් අත්විඳිමින් දැනුම වර්ධනය කරගැනීමට අවශ්‍ය අවකාශය සලසනු ලබයි. බොහෝ කෞතුකාගාර මගින් එකී කෞතුකාගාර අයත් රටට අදාළ දේශීය උරුමය පිළිබඳ තොරතුරු සමාජගත කිරීමට කටයුතු කරයි (Ambrose & Paine, 2006:9-10). දේශීය උරුමය වඩා සාධනීයව සමාජගත කිරීම වක්‍රාකාරයෙන් රටෙහි හා ගෝලීය සංවර්ධනය කෙරෙහි බලපානු ලබයි. එම කාර්යයේ සාර්ථකත්වය රඳාපවතින්නේ ළමා අවධියේදී ම ඉහත කී අත්විඳීම් ලබාදීමෙනි.

ළමා අධ්‍යාපනය කෙරෙහි බලපෑම් කාරකයක් ලෙස කෞතුකාගාර ව්‍යුහගත කිරීමේ වගකීම් පැවරෙන කණ්ඩායම් කිහිපයකි. සියලු ම කෞතුකාගාරවල භාරකරුවන්, කාර්යය මණ්ඩලය, සහ ස්වේච්ඡා කාර්යය මණ්ඩලය විසින් නිරවද්‍යතාවයෙන් යුක්තව, පැහැදිලි ලෙස සහ අදාළත්වයෙන් යුක්ත ව කෞතුකාගාරය සතු අධ්‍යාපනික සම්පත් ජනතාව අතරට රැගෙනයාමට හැකිවන පරිදි කෞතුකාගාර මෙහෙවර ප්‍රකාශය සකස්කළ යුතුය. (Excellence in Practice: Museum Education Principles and Standards, 2005: 6).

කෞතුකාගාර අධ්‍යාපනය ළමයා කෙරෙහි ඇති කරනු ලබන බලපෑම සම්බන්ධයෙන් කෞතුකාගාර විද්‍යා මූලධර්ම (1996) කෘතියේ දක්වා ඇත්තේ "ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් සලකා බලන විට නිරීක්ෂණය, බුද්ධිය, විනිශ්චය කිරීම හා අනාවරණය පිළිබඳ ළමයා සතු ශක්තිය උත්තේජනය කිරීමෙහි ලා කෞතුකාගාර මාධ්‍යය, සෙසු මාධ්‍යයන් අතුරෙන් ප්‍රබල එකක් වන්නේය" යනුවෙනි.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

කෞතුකාගාර ළමා අධ්‍යාපනය කෙරෙහි සාධනීය බලපෑමක් සිදු කළ හැකි ආයතනයක් වශයෙන් මේ අනුව පැහැදිලි වේ. ඒ සඳහා ළමයා කෙරෙහි අධ්‍යාපනය ලබාදීම වඩා සැළකිල්ලෙන් කළ යුතු කාර්යයකි. ඒ මන්ද යත් ළමා අවධියේදී ලබාගන්නා විවිධ ආකාරයේ අත්දැකීම් ළමයා වයසින් වැඩෙත්ම පෞර්ෂ වර්ධනයට, සමාජ සුබ සිද්ධියට ආදී ප්‍රපංචයන් කෙරෙහි බලපානු ලබන බැවිනි. අධ්‍යාපනික මෙවලමක් වශයෙන් කෞතුකාගාර යොදා ගැනීමේදී කෞතුකාගාර අධ්‍යාපනික මෙවලමක් වශයෙන් ව්‍යුහගත කිරීම, ඒ තුළින් ළමයා තුළ වර්ධනය වන ලක්ෂණ, ළමයා තුළ සංවර්ධනය වන ලක්ෂණයන්හි දිගුවක් ලෙස සමාජයට, රටට සහ සමස්ත ලෝකයට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ දාමයක් ගොඩනැගෙන බව පහත සංකල්ප රාමුව කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වේ (රූපය 01).

## 2. ක්‍රමවේදය

මෙම පර්යේෂණය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන දත්ත ආකාර දෙකම භාවිත කරමින් මිශ්‍ර ක්‍රමවේදයක් ඔස්සේ දත්ත සපයාගෙන තිබේ. විශේෂයෙන් ම දත්ත රැස් කිරීමේදී ශ්‍රී ලංකාව තුළ දැනට පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ ද්විත්වයේම තෝරාගත් කෞතුකාගාරවල සහභාගීත්ව නිරීක්ෂණ සිදු කිරීමත් එම කෞතුකාගාර විසින් පවත්වනු ලබන විවිධ වැඩසටහන් මෙන් ම ඔවුන්ගේ වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය පරිහරණය කිරීමත් සිදු කරමින් අධ්‍යතන ශ්‍රී ලාංකේය කෞතුකාගාරයන්හි තේමා සහ කාර්යයන් පිළිබඳ තොරතුරු රැස් කරන ලදි. දත්ත රැස් කිරීමේදී ළමයා අරමුණු කරගෙන ජාත්‍යන්තර කෞතුකාගාර විසින් සිදු කරනු ලබන කාර්යයන් ද සහභාගීත්ව නිරීක්ෂණ මගින් සහ මාර්ගගතව අධ්‍යයනය කරන ලදි. අමතරව කෞතුකාගාර විද්‍යාව පිළිබඳ මූලධර්ම, අධ්‍යාපනවිද්‍යාව සහ ළමා මනෝවිද්‍යාව පිළිබඳ න්‍යායන් අධ්‍යයනය සිදු කරන ලද අතර දත්ත විශ්ලේෂණයේදී රැස් කළ දත්ත ජාත්‍යන්තර උදාහරණ සහ න්‍යායාත්මක ප්‍රවේශ සමග සමගාමීව විමසමින් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර සම්බන්ධව වඩා උචිත සංකල්ප රාමුවක් නිර්මාණය කිරීම සිදු කරන ලදි.

## 3. ප්‍රතිඵල සහ සාකච්ඡාව

### ශ්‍රී ලංකාවේ කෞතුකාගාර හා ළමා අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ කෞතුකාගාර මගින් ළමා අධ්‍යාපනය සඳහා වර්තමානයේදී ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳව ත් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර මගින් ළමා අධ්‍යාපනය සඳහා ක්‍රියාත්මක කළ හැකි නව වැඩසටහන් පිළිබඳව ත් එ මගින් සමාජය වෙත සිදුකළ හැකි බලපෑම පිළිබඳව ත් මෙහිදී සාකච්ඡා කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ දැනට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, වෙනත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ආයතන, ආගමික මධ්‍යස්ථාන, පාසල් සහ විශ්වවිද්‍යාල යටතේ කෞතුකාගාර ක්‍රියාත්මක වේ. මෙම කෞතුකාගාර ඔස්සේ විවිධ විෂයය පථයන් හා සම්බන්ධ එකතුන් ප්‍රදර්ශනය කරනු ලබයි. එසේ ම, මෙම කෞතුකාගාර ඔස්සේ පර්යේෂණ පැවැත්වීම ත් හා ප්‍රදර්ශන පැවැත්වීම ත් මහජනයාගේ අධ්‍යයනයට-අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ත් සිදුවේ.

උදාහරණ ලෙස ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන කෞතුකාගාර මගින් අධ්‍යාපනික වැඩසටහන් ලෙස කෞතුකාගාරය තුළ දේශන පැවැත්වීම, පාසල් වෙත ගොස් දේශන පැවැත්වීම, කෞතුකාගාර බස් රථය (Museum Bus) මගින් ජංගම ප්‍රදර්ශන පැවැත්වීම, තාවකාලික ප්‍රදර්ශන සංවිධානය කිරීම, කෞතුකාගාරය තුළ මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අත්පත්‍රිකා මගින් තොරතුරු සම්ප්‍රේෂණය කිරීම ආදිය සිදුකරනු ලබයි. එසේ ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන කෞතුකාගාර මගින් අධ්‍යාපනික වැඩසටහන් ලෙස කෞතුකාගාරය තුළ දේශන පැවැත්වීම, පාසල් වෙත ගොස් දේශන පැවැත්වීම, පාසල් මට්ටමෙන් සංගම් පිහිටුවීම, ජංගම ප්‍රදර්ශන පැවැත්වීම, තරග පැවැත්වීම ආදී කටයුතු සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් කෞතුකාගාර නැරඹීම සඳහා සම්බන්ධ කරගැනීම සාමාන්‍යයයෙන් වාර්ෂික අධ්‍යාපන චාරිකාවක ස්වරූපයෙන් ක්‍රියාත්මක වේ. නිදසුනක් වශයෙන් කොළඹ ජාතික කෞතුකාගාරය නැරඹීම සඳහා විවිධ ප්‍රදේශවල සිට සිසුන් රැගෙන ඒම පාසල් මට්ටමින් සිදුවේ. කෞතුකාගාරය නැරඹීමේදී කෞතුකගාරයේ එකතුව සම්බන්ධයෙන් ළමුන් දැනුවත් කිරීමේ අධ්‍යාපනික වැඩසටහනක් පවත්වනු ලබයි. මෙලෙස අධ්‍යාපනික වැදගත්කමක් සහිත වැඩසටහනක් ඔස්සේ ළමුන් දැනුවත් කිරීම ප්‍රගතිශීලී වුව ද ලෝකයේ වෙනත් කෞතුකාගාර සමග සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ කෞතුකාගාර මගින් ළමුන් වෙනුවෙන් පවත්වනු ලබන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් ප්‍රමාණවත් නොවන බව පැහැදිලිව දැකගත හැකිය. එහෙයින්, ළමා අවධියේ දී ළමයින්ගේ සිත තුළ කෞතුකාගාර නැරඹීම සම්බන්ධයෙන් අනුස්මරණීය අත්දැකීමක් සනිටුහන් කිරීම වඩාත් උචිත වේ.

### ශ්‍රී ලංකාවේ කෞතුකාගාර හා ළමා අධ්‍යාපනය සඳහා නව ප්‍රවේශයක්

ඉහත සාකච්ඡාවට ලක් කර තිබෙන ශ්‍රී ලංකාවේ කෞතුකාගාරවල ළමා අධ්‍යාපනය කෙරෙහි දැනට පවතින තත්ත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ තවමත් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර අධ්‍යාපනය සාම්ප්‍රදායික ක්‍රම මත යැපීමට සිදු වී තිබෙන බවයි. අධ්‍යාපනය හරයාත්මක ලෙස වෙනස්වන සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික තත්ත්වයන්ට සමගාමීව සාධනීය ආකාරයෙන් වෙනස්කම්වලට ලක්කිරීම ඵලදායීවන බැවින් ළමා අධ්‍යාපනයට උචිතවන පරිදි ද එම වෙනස්කම කෞතුකාගාරවල සිදු කිරීම වැදගත් වේ. එහිදී සැලකිළිමත් විය යුතු ප්‍රධාන තත්ත්වයන් කිහිපයකි. වයස් කාණ්ඩ පිළිබඳ අවධානය යොමු කිරීම, ඒ ඒ වයස් කාණ්ඩවලට උචිත වැඩසටහන් සම්පාදනය කිරීම සහ නව තාක්ෂණික භාවිතය ඒ අතර ප්‍රමුඛ වේ. මේ සඳහා සුදුසු ජාත්‍යන්තර උදාහරණ ඉහත සඳහන් කොට ඇති අතර එම උදාහරණ කෙරෙහි ද



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

සැලකිළිමත් වෙමින් ශ්‍රී ලංකාවට ගැලපෙන ක්‍රමවේද සකස් කරගැනීම වැදගත් වේ.

සාම්ප්‍රදායික කෞතුකාගාර ළමයින්ගේ අධ්‍යාපනික මෙවලමක් වශයෙන් ප්‍රතිව්‍යුහගත කිරීමේදී අංග රාශියක් කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කළ යුතු බව ඉහත පැහැදිලි කර තිබේ. මෙහිදී අවධානය යොමු කළ යුත්තේ වයස් කාණ්ඩ අනුව වෙන් කරමින් මූලික ක්‍රමවේද භාවිතයට උත්සාහ ගැනීමයි. කෞතුකාගාර නැරඹීම පිණිස දෛනිකව විවිධ වයස් මට්ටම්වලට අදාළ ළමයි පැමිණෙති. කෞතුකාගාර ළමා අධ්‍යාපනය කෙරෙහි උචිත වන ආකාරයෙන් ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඒ ඒ වයස් මට්ටම්වලට උචිත පරිදි අවශ්‍ය ක්‍රියාකාරකම් සංවිධානගත කළ යුතු වේ. මෙහිදී වයස් කාණ්ඩ වර්ගීකරණය සැළකිල්ලෙන් කළ යුතු කාර්යයකි. පොදුවේ මුල් ළමාවිය, මධ්‍යම ළමාවිය සහ නවයොවුන් විය වශයෙන් ළමාවිය බෙදා දැක්වුව ද ඊට වඩා සූක්ෂම ඛණ්ඩනය කිරීමක් තුළින් ළමයින් අධ්‍යාපනික වැඩසටහන් කෙරෙහි ආකර්ෂණය කර ගැනීමට හැකි බව කෞතුකාගාර සම්බන්ධ ජාත්‍යන්තර උදාහරණ මගින් දැක්විය හැකි වේ. ලන්ඩනයේ ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ නිල වෙබ් අඩවියේ වයස් කාණ්ඩ වර්ගීකරණය මෙහිදී උදාහරණයක් ලෙස සඳහන් කළ හැකි වේ. එනම්,

- පදනම් අදියර (වයස අවුරුදු 5ට නොවැඩි)
- පළමු අදියර (වයස අවුරුදු 5 - 7)
- දෙවන අදියර (වයස අවුරුදු 7 - 11)
- තෙවන අදියර (වයස අවුරුදු 11 - 14)
- සිවුවන අදියර (වයස අවුරුදු 14 - 16)
- වයස අවුරුදු 16න් පසු අදියර (වයස අවුරුදු 16 - 18)

වයස පිළිබඳ සිදු කරනු ලබන වර්ගීකරණයන්ගෙන් පසු අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් වන්නේ කෞතුකාගාරය තුළ නිර්මාණය කිරීමට සුදුසු අධ්‍යාපනික ආකෘතිය පිළිබඳ තීරණය කිරීමයි. එක් ආකෘතියක් හෝ ආකෘති කිහිපයක් ළමා අධ්‍යාපනය සඳහා කෞතුකාගාර තුළ භාවිත කිරීමේ හැකියාව පවතී. ඒ අනුව ජාත්‍යන්තරය හා සසඳමින් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර තුළ ක්‍රියාත්මක කළ හැකි අධ්‍යාපනික ආකෘති කිහිපයක් පහත පරිදි වේ.

➢ කෞතුකාගාරය තුළ භෞතික සැකැස්ම
  - යම්කිසි ආඛ්‍යානයක් නිරූපණය කළ හැකි වන පරිදි ඵලදායී ලෙස කෞතුක භාණ්ඩ තෝරාගෙන ප්‍රදර්ශනය සැලසුම් කිරීම.
  - කෞතුක භාණ්ඩ ලේබල් සහ මැදිරි ආශ්‍රිත විස්තර පුවරු වලින් ඔබ්බට ගොස් නව ක්‍රමවේද ඔස්සේ (Gallery Cards වැනි) විස්තෘත දැනුමක් කෞතුකාගාර තුළ සම්පාදනය කිරීම.
  - ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණය භාවිතය (Audio Guide, Museum App, Digital Database, 3D සහ VR තාක්ෂණය).
  - අනුකරණය මගින් අධ්‍යාපනය ලබා දීම (චිත්‍ර සහ මූර්තිවල හස්ත, පාද හා අභින අනුකරණය, ආයුධ සහ මෙවලම් භාවිතය අනුකරණය, වාදන හා ගායනා අනුකරණය, සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම අනුකරණය).
  - ළමා ප්‍රජාවට ආකර්ෂණීය වන පරිදි සහ ඔවුන්ට පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි වන පරිදි කෞතුකාගාරය සැලසුම් කිරීම (කෞතුකාගාරය තුළ භාවිත කර ඇති වර්ණ, හැඩතල, ආලෝකකරණය වැනි අංග).
  - ප්‍රායෝගික ක්‍රියාකාරකම් සංවිධානය කිරීම (Hands on experiences)- ශිලා මෙවලම් නිෂ්පාදනය, මැටි භාණ්ඩ සැකසීම.
  - විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම (Learn by touching, Learn by touching, Braille, මැදිරි නැරඹීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම).
  - විවිධ වැඩසටහන් සංවිධානය කිරීම (විශේෂ දින මූලික කරගත් වැඩසටහන්, සංස්කෘතික වැඩසටහන්, දේශන, වැඩමුළු, රාත්‍රී කාලයේදී කෞතුකාගාරය නැරඹීම).

➢ කෞතුකාගාරය තුළ මාර්ගගත (Online) සැකැස්ම
  - පූර්ව ප්‍රචාරක වැඩසටහන් (Museum Trailers)
  - මාර්ගගත ප්‍රදර්ශන (Online Exhibitions)
  - මාර්ගගත කෞතුකාගාර භාණ්ඩ එකතුන් (Online Collections)
  - Virtual Tours
  - මාර්ගගත තරග පැවැත්වීම (ප්‍රෙහේලිකා, ඡායාරූප, චිත්‍ර, කෙටි වාර්තාමය වැඩසටහන්)
  - වාර්තාමය වැඩසටහන් සහ කතාන්දර වැඩසටහන්
  - සිතියම් සහ මාර්ගෝපදේශන පත්‍රිකා
  - මාර්ගගත පාඩම් (Online lessons)
  - කෞතුකාගාරය නැරඹීමට පෙර සහ පසු සිදුකළ හැකි ක්‍රියාකාරකම්

## 4. සමාලෝචනය

දැනුම ප්‍රවර්ධනය සහ මානව ජීවිතය පෝෂණය කිරීම සඳහා කෞතුකාගාර සතු ඉතා වැදගත් සම්පත් භාවිත කිරීමට සෑම කෞතුකාගාරයක් ම කැපවී සිටින බව ඉහත සමස්ත ප්‍රකාශනය ඔස්සේ ම අවධාරණය වී තිබේ. එසේම කෞතුකාගාර හරහා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට සෑම කෞතුකාගාරයකම කෞතුකාගාර භාරකරුවන්, කාර්යය මණ්ඩලය, සහ ස්වේච්ඡා කාර්යය මණ්ඩලය එක්ව කටයුතු කළ යුතු බව ද ඉහත දක්වා තිබේ. ඒ අනුව සනාථවන මූලික කරුණක් වන්නේ කෞතුකාගාර කෞතුක භාණ්ඩ ප්‍රදර්ශනයට සහ ආරක්ෂාවට නිර්මාණය කරගත් ආයතනික ව්‍යුහයක් පමණක් නොව විවිධ ස්වරූපයෙන් අධ්‍යාපනය ලබා දීම පිණිස නිර්මාණය වූවක් ද බවයි. අධ්‍යාපනය ලබා දීම යනුවෙන් නිශ්චිත පිරිසකට පමණක් (ළමයින්ට, පාසල් සිසුන්ට, විශ්වවිද්‍යාල සිසුන්ට සහ වැඩිහිටියන්ට ආදී වශයෙන්) කෞතුගාරවලින් අධ්‍යාපනය ලබාදීම වැනි අර්ථයක් නොකිය වේ. නමුත් මෙම අධ්‍යයනය ඔස්සේ මූලික අවධානයක් යොමු වී තිබෙන්නේ වයස අවුරුදු 18 දක්වා කාල පරාසයට අයත් ළමයින් වෙනුවෙන් ලබාදෙන අධ්‍යාපනය පිළිබඳවයි.

ඉහත සාකච්ඡාවේදී දක්වා තිබෙන ජාත්‍යන්තර කෞතුකාගාරවල ළමා අධ්‍යාපනය ම අරමුණු කරගත් වැඩසටහන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ ඔවුන් ඒ සඳහා සාම්ප්‍රදායිකව භාවිත වූ ක්‍රමවේද මෙන් ම නව තාක්ෂණික භාවිතයන් ද සංකලනය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618

කරගනිමින් ක්‍රියාකාරකම් සැළසුම් කර ඇති බවයි. නමුත් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමේදී පැහැදිලි කර තිබෙනන්නේ අප තවමත් කෞතුකාගාර සහ ළමා අධ්‍යාපනය පමණක් නොව කෞතුකාගාර සහ අධ්‍යාපනය කෙරෙහි ද අවශ්‍ය තරම් අවධානයක් යොමු කර නැති බවයි. කෞතුකාගාර මගින් නිර්මාණය කරන අධ්‍යාපනය හුදෙක් විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් වැනි එකක් නොවේ. කෞතුකාගාර ඔස්සේ මූලිකවම තමන්ගේ උරුමය යොදාගනිමින් ලබාගනු ලබන පරිචයන් ආශ්‍රයෙන් පොදුවේ පුද්ගලයා, සමාජය, රට සහ සමස්ත ලෝකයට ම ඵලදායී දෑ ලබාගත හැකි බව ඉහත සාකච්ඡාවෙන් අවධාරණය කර ඇත.

ඉහත සමස්ත පැහැදිලි කිරීම් ඔස්සේ න්‍යායාත්මක වශයෙන් කොතුකාගාර සහ අධ්‍යාපනය පිළිබඳ ගොඩනැගූ දැනුම ජාත්‍යන්තර කෞතුකාගාර විසින් ළමා අධ්‍යාපනය පිණිස ගෙන ඇති පියවර සම්බන්ධ අත්දැකීම් සමග විග්‍රහ කරගනිමින් ශ්‍රී ලංකාවේ කෞතුකාගාර ක්‍රියාවලිය තුළ ළමා අධ්‍යාපනය සඳහා සුදුසු ආකෘති නිර්මාණය කරගැනීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කර තිබේ. නමුත් එම යෝජනා ක්‍රියාවට නැංවීමට නම් කෞතුකාගාර පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම අත්‍යවශ්‍ය තත්ත්වයකි. එලෙස කෞතුකාගාර ළමා අධ්‍යාපනය වෙනුවෙන් ප්‍රතිව්‍යුහගත කරන්නේ නම් වර්ථමාන සහ අනාගත ශ්‍රී ලංකාවේ ආර්ථිකමය සහ සමාජීමය ක්ෂේත්‍ර රැසක ප්‍රගමනයට එය සාධනීය ආකාරයෙන් දායක කරගැනීමේ හැකියාව තිබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි


ද සිල්වා, පී. එච්. ඩී. එච්. 1996, ***කෞතුකාගාර විද්‍යා මූලධර්ම***, කතෘ ප්‍රකාශන.

දිසානායක, ජී. ආර්. 1999, ***ශ්‍රී ලංකාවේ කෞතුකාගාර සහ සන්නිවේදනය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

Ambrose, T. & Paine, C. 2006, ***Museum Basics***, Routledge.

Dean, D. 1994, *Museum Exhibition Theory and Practice*, Routledge.

Hein, G. 1998, ***Learning in the Museum***. Routledge.

***Excellence in Practice:*** *Museum Education Principles and Standards*, 2005, Ed. Fortescue, A. and et al. American Association of Museum.

***Key Concepts of Museology***, 2010, Ed. André Desvallées and François Mairesse Armand Colin.

Moore, K. 1994, ***Museum Management***. Routledge, New York.

**American Association of Museums** [https://www.aam-us.org/programs/ethics-standards-and-professional-practices/code-of-ethics-for-museums/]

**ICOM Statutes adopted by the 22nd General Assembly Vienna,** Austria, 24 August 2007 (http://icom.museum/the-vision/museum-definition/)London Natural History Museum official webpage [http://www.nhm.ac.uk/]

**Louvre Museum official webpage** [http://www.louvre.fr/en]

**Metropolitan Museum official webpage** [http://www.metmuseum.org/]

**Newdelhi National Museum official webpage** [http://www.nationalmuseumindia.gov.in/]

**UNICEF official webpage** [https://www.unicef.org/child-rights-convention/convention-text]




රූපය 01
සංකල්ප රාමුව (කතුවරුන් විසින් සකසන ලද්දකි)



ඡායාරූපය 01
නවදිල්ලි ජාතික කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනික වැඩසටහන්
(http://www.nationalmuseumindia.gov.in/en)




ඡායාරූපය 02
#MetKids වැඩසටහන
(https://www.metmuseum.org/)



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. +94 25 2266618



ඡායාරූපය 03
#MetKids වැඩසටහන (https://www.metmuseum.org/)




ඡායාරූපය 04
ලන්ඩනයේ ස්වභාවිකවිද්‍යා කෞතුකාගාරය ආශ්‍රිත ළමා අධ්‍යාපනික වැඩසටහන් (https://www.nhm.ac.uk/)




ඡායාරූපය 05
A closer look at the Seated Scribe වැඩසටහන
(http://www.louvre.fr/en)

Archaeological and Architectural Monuments Depicted on Sri Lankan Currency Notes
( From 1951 to 2013 currency notes series issued by the Central Bank of Sri Lanka)
Upeksha Gamage, Harshani Pathmakulasooriya

Tourism Industry in Sri Lanka (With Reference to Cultural Tourism)
Chandrapala M.D.S.H

Corpus of ESP Keywords in Archaeology and Heritage Management to Facilitate Second Language Pedagogy
Dhanapala R.M

Interference of Mid-Holocene Hunter Gathers to Coastal Shell Bearing Habitats at Southern Coastal Zone of Sri Lanka
Suranga E.G.J , Gamini Adikari

Industrial Heritage in Kandy, Sri Lanka
Vishwa Mithra Swarna Sri Jayasingha

Origin of Sri Lankan Art: Sculptures of Frontspiece (Ayaka)
Senarath Bandara Dissanayake

Enhancing Child Education through Positively Organizing Museums
Piyumi Ambuldeniya, Buddhisha Weerasuriya

Department of Archaeology & Heritage Management
Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale



ISSN 2357-2604
9 772357 260000